හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை

Office for Reparations - Sri Lanka










වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

2023

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව 2023

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

අංක 40, බුත්ගමුව පාර,

රාජගිරිය.

දැක්ම

ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීම සහ ආර්ථික හා සමාජීය සමෘද්ධිය තුළින් මානව හිමිකම් තහවුරු කිරීම.

මෙහෙවර

පීඩාවට පත් පාර්ශ්වයන් සවිබල ගැන්වීමේ හානිපූරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම.

පටුන

සභාපතිනියගේ පණිවිඩය.....5

01. හැඳින්වීම.....6

02. හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින්.....6

03. ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ.....7

04. සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්.....7

4.1 ජීවනෝපාය සහාය වැඩසටහන්.....8

4.2 වන්දි සහ මූල්‍යමය සහාය.....11

4.3 පරිපාලන සහාය.....15

4.4 මනෝ සමාජීය සහාය.....15

05. මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.....16

5.1 තොරතුරු කළමනාකරණ පද්ධතිය **(IMS)**.....16

5.2 කාර්ය මණ්ඩල ධාරිතාව ගොඩනැගීම.....16

06. විගණන හා කළමනාකරණ කමිටුව.....17

07. සාමාන්‍ය විගණනය.....17

08. ලේකම් කාර්යාලය.....17

09. මූල්‍ය ප්‍රගතියේ සාරාංශය.....18

10. කෘතඥතාව.....18

11. විගණකාධිපති වාර්තාව.....41

සභාපතිනියගේ පණිවිඩය

රජයේ අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් නොලැබුණු සහන පීඩාවට පත් තැනැත්තන්ට ලබා දීමට හෝ මේ වනවිටත් ලබා දී ඇති ප්‍රතිලාභ අවශ්‍ය අවස්ථාවල දී අතිරේකව ලබා දීමට, **2023** වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සමත්ව ඇත. මෙම ප්‍රවේශය, කාර්යාලය විසින් අනුගමනය කරනු ලබන "අවශ්‍යතා මත පදනම් වූ" ප්‍රතිපත්තියට අනුකූල වේ. ඒ අනුව, හානිපූරණ ප්‍රතිපත්තිය තුළ සහන සැලසීම සඳහා වන තේමා ක්ෂේත්‍ර අට **(08)** අතරින්, මනෝ සමාජීය සහාය, මූල්‍යමය සහාය සහ ජීවනෝපාය සංවර්ධනය යන ක්ෂේත්‍රවලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. විශේෂයෙන් ම, නව ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵල පීඩාවට පත් තැනැත්තන්ට හිතකර අයුරින් සිදුවන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා එකී වැඩසටහන් අධීක්ෂණය කරනු ලැබේ. මෙම වැඩසටහන් මගින් ආර්ථික ස්වාධීනත්වය ඉහළ නැංවීම සඳහා ගෘහ මූලික කාන්තාවන් සවිබල ගැන්වීමට ප්‍රමුඛතාව ලබා දී ඇත.

සහන ඉල්ලීම් අයදුම්පත් සමඟ කටයුතු කිරීම සඳහා විනයානුකූල සහ කාර්යක්ෂම ක්‍රියාවලි හඳුන්වාදීමේ කටයුතු සඳහා ද සාමාජිකයෝ දායක වූහ. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ සඳහා මූල්‍යමය සහන ලබා දීම සඳහා වන ඉල්ලීම් වසර ගණනාවක සිට පැවති බැරෑරුම් ගැටලුවක් විය. මෙම කාරණයට ප්‍රමුඛතාව ලැබිණ. 2022 වසරේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පීඩාවට පත් වූ අයට මූල්‍යමය සහන සැලසීමේ කර්තව්‍යය ද එම වසරේ සම්පාදනය කරන ලද ක්‍රියාවලිය අනුව ඉදිරියට ගෙන යන ලදී. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පියවරින් පියවරට ලැබීම හේතුවෙන් සියලුම කාණ්ඩයන්ට එක හා සමානව සලකමින් උපරිම වශයෙන් පීඩාවට පත් වූ අයට ප්‍රමුඛත්වය දීමේ පදනම මත සහන සලසන ලදි.

2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු සහන ඉල්ලා යොමුකර ඇති මූලික අයිතිවාසිකම් ඉල්ලීම්වලට අදාළව **2023** ජනවාරි **12** වැනි දින ලබා දුන් තීරණය අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම කාර්යාලයට වගකීම් කීපයක් පවරන ලදී. මෙම කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතු විස්තරාත්මක ලෙස මෙම වාර්තාවෙහි ඇතුළත් කර ඇති අතර, අප ආයතනයේ වෙබ් අඩවියෙහි ද උඩුගත කර ඇත. විශ්වසනීයත්වය පිළිබඳව පමණක් සලකා බලා උත්තරීතර අධිකරණය විසින් මෙකී බැරෑරුම් වගකීම් මෙම කාර්යාලය වෙත පවරනු ලැබ ඇත.

කාර්යාලය නිසි ලෙස පවත්වා ගැනීමේ දී කාර්ය මණ්ඩල බඳවා ගැනීම්වලට පනවා ඇති සීමාවලට යටත්ව කටයුතු කිරීම සාමාජිකයන්ට සේම කාර්ය මණ්ඩලයට ද අභියෝගාත්මක වූ මුත්, එකී සීමාවල අවශ්‍යතාව හඳුනාගෙන කටයුතු කෙරිණ.

කාර්යාලයේ කටයුතු සඳහා අනෙක් සාමාජිකයන් සිවු දෙනා ලබා දෙන දායකත්වයත්, තීරණ ගැනීමේ දී ඔවුන් ලබාදෙන සහායත්, සභාපතිනිය ලෙස මම කෘතඥතාපූර්වකව සිහිපත් කරමි. ඔවුන් සමඟ කටයුතු කිරීමට ලද අවස්ථාව මා භාග්‍යයක් කොට සලකන අතර, **2024** වසර ද සාර්ථක ලෙස වැඩකටයුතු කළ හැකි වන වසරක් වේවා යැයි ද මම පතමි.

නීතීඥ ධාරා විජයතිලක
සභාපතිනිය

01. හැඳින්වීම

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ ("පනත") ප්‍රකාශ කර ඇති අරමුණු සහ ඒ යටතේ සකස් කර ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව පීඩාවට පත් ප්‍රජාවගේ අවශ්‍යතාවයන් ඉටු කර දීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) සිය පස්වන වසරේදී ද සිය ක්‍රියාකාරකම් නොකඩවා සිදු කරගෙන යන ලදී. පනතේ දක්වා ඇති පරිදි හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුණු පහත පරිදි වේ -

1. පීඩාවට පත් තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම.
2. මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම.
4. යෝග්‍ය, පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයුම් කිරීම.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ 2022 පෙබරවාරි මස පාර්ලිමේන්තුවේ සභාගත කර 2022 මාර්තු 3 දිනැති අංක 2269/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. පීඩාවට පත් තැනැත්තන්ට (වින්දිතයින්ට) සහන සැලසීම සඳහා මැදිහත්වීම් තේමා ක්ෂේත්‍රයන් අටක් (08) සහ සහන සැලසීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයන් දහයක් (10) ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇත.

02. හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින්

සමාලෝචිත වර්ෂය තුළ දී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් පහත පරිදි වේ,

1. නීතීඥ ධාරා විජයතිලක මහත්මිය - සභාපතිනිය (2022 ජූනි 12 දින නැවත පත් කරන ලදී)
2. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු - සාමාජික (2021 මැයි 24 දින පත් කරන ලදී)
3. ආචාර්ය අසීස් මුබාරක් - සාමාජික (2022 ජූලි 6 දින පත් කරන ලදී)
4. නීතීඥ රසික දිසානායක මහතා - සාමාජික (2022 ජූලි 6 දින පත් කරන ලදී)
5. නීතීඥ ශන්මුගප්‍රියා සිවගනනාදන් මහත්මිය - සාමාජික (2022 අගෝස්තු 5 දින පත් කරන ලදී)

පනතේ 6 වන වගන්තිය අනුව, සියලුම සාමාජිකයින් වසර තුනක (03) කාලයක් සඳහා පත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සාමාන්‍යයෙන් සෑම මසකම දෙවරක් රැස් වූ අතර රැස්වීම් විස්සක් පැවැත්විය. රැස්වීම් සඳහා මනා සහභාගීත්වයක් පැවැති අතර, රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සමස්ත සමස්ත පැමිණීම 95% සිට 100% දක්වා විය.

03. ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ

නිශ්චිත සහන ප්‍රදානයන් තීරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අනුව මැදිහත්වීම් සඳහා හඳුනාගෙන ඇති තේමා ක්ෂේත්‍ර පහත දැක්වේ –

ප්‍රතිපත්තීන් තුළ මැදිහත්වීම් සඳහා හඳුනාගෙන ඇති තේමා ක්ෂේත්‍ර -

1. ජීවනෝපාය සහාය
2. වන්දි සහ මූල්‍යමය සහාය
3. ඉඩම් අයිතීන් නැවත ලබා දීම සඳහා සහාය
4. නිවාස සැපයීම සඳහා සහාය
5. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
6. පරිපාලන සහන
7. මනෝ සමාජීය සහාය
8. සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර

- මාර්ගෝපදේශ -

1. චින්දිත කේන්ද්‍රීයතාව - පීඩාවට පත් තැනැත්තන්ට අවශ්‍ය දේ කුමක් ද යන්න මත පදනම්ව සියලුම තීරණ ගනු ඇත.
2. පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා ගැනීමට යෝග්‍යතා සඳහා වන නිර්ණායක.
3. යෝග්‍ය, පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය.
4. මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක.
5. නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක.
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි ආයතනයන්.
7. සත්‍යාපනය කරන ලද හානිපූරණය සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක.
8. තත්‍යභාවය සත්‍යාපනය කිරීමේ නිර්ණායක.
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම සහ ස්මාරක සඳහා වන නිර්ණායක.
10. පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම.

04. සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්

බරපතල කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් (පහත "ලේකම් කාර්යාලය" යටතේ බලන්න), මෙම කාර්යාලයට එහි සේවා ක්ෂේත්‍ර ප්‍රමුඛතාගත කිරීමටත්, පීඩාවට පත් පුද්ගලයින්ට සහාය දැක්වීම සඳහා අර්ථවත් වන ඉතාමත්ම හදිසි මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමටත් සිදු වී ඇත. එසේ සිදු කිරීමේ දී වෙනත් රාජ්‍ය ආයතන විසින් දැනටමත් ක්‍රියාත්මක කරමින් තිබූ ක්ෂේත්‍රයන් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ක්‍රියාත්මක නොකරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් සහාය ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කෙරිණි-

අ) පීඩාවට පත් පුද්ගලයින්ගේ ආදායම් උත්පාදන විභවයන් වැඩිදියුණු කිරීම සඳහා දැනුම හුවමාරු කිරීම සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන් හරහා ජීවනෝපාය සහාය ලබාදීම සහ එමගින් ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම.

ආ) මූල්‍යමය සහන ලබා දීම; සහ

ඇ) මනෝසමාජීය සහාය ලබා දීම

4.1 ජීවනෝපාය සහාය වැඩසටහන්

පීඩාවට පත් ප්‍රජාවේ පුද්ගලයින්ට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම පිණිස, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නව ජීවනෝපාය වැඩසටහන් ආරම්භ කිරීම් සහ ව්‍යවසායකත්වයන් සඳහා සහාය ලබා දීම සිදු කරන ලදී. නව වැඩසටහන් සඳහා අවශ්‍යතා තක්සේරු කිරීමේ දී දේශීයව පවතින සම්පත් භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

මෙම වර්ෂය තුළ පහත වැඩසටහන් ආරම්භ කරන ලදී:

	වැඩසටහනේ ආරම්භක දිනය	ස්ථානය	පීඩාවට පත් පුද්ගල කාණ්ඩය	සහභාගී වූ සංඛ්‍යාව	හුවමාරු කළ තාක්ෂණ ක්ෂේත්‍රය
01	2023.11.28	සෆාමරුව ඒ, කරඹ, පාලවී, පුත්තලම	කාන්තාවන්	10	පොල් කෙඳි ආශ්‍රිත තවාෂි බුරුසු නිෂ්පාදනය
02	2023.12.04	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෝපායි, යාපනය	ගෘහ මූලික කාන්තාවන්	25	අගය එකතු කළ ඉටිපන්දම් සෑදීම සහ මූල්‍ය සාක්ෂරතාවය *(Light for Life / ජීවිතයට ආලෝකය)*
03	2023.12.22	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්නාරම	ගෘහ මූලික කාන්තාවන්	05	තල් කොළ අත්කම් නිෂ්පාදනය *(වර්ණවත් දෑත් / Colouring Hands)*
04	2023.12.22	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්නාරම	අභ්‍යන්තරව අවතැන් වූ පවුල්	05	ඉදල් නිෂ්පාදනය – *(වර්ණවත් දෑත් / Colouring Hands)*

01. අභ්‍යන්තරව අවතැන් වූ පීඩාවට පත් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

පුත්තලම ප්‍රදේශයේ අවතැන් වූ කාන්තාවන් සඳහා තිරසාර ආදායම් උත්පාදනයක් ඇති කිරීම සහ දිළිඳුකම අවම කිරීමේ අරමුණට ප්‍රමුඛත්වය ලබා දෙමින්, මෙම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස පීඩාවට පත් කාන්තාවන් 10 දෙනෙකු ඉලක්ක කර ගනිමින් 2023 නොවැම්බර් 28 වන දින සෆාමරුව ඒ, කරඹ, පාලවියේ දී පැවැත්විණි. ව්‍යාපෘතියේ පාර්ශ්වකරුවන් වූයේ මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (MWDT), අපනයන වෙළෙඳපොළ සඳහා නිෂ්පාදන සිදු කරනු ලබන BOI සමාගමක් වන Alliance Five Private Limited (AFPL) සහ සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) වේ. කෙඳි

ආශ්‍රිත බුරුසු නිෂ්පාදනය කිරීම සඳහා AFPL විසින් ප්‍රතිලාභීන් පුහුණු කොට, බුරුසු නිෂ්පාදනය ආරම්භ කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් MWDT සමඟ එක්ව ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.









02. ජීවිතයට ආලෝකය (Light for Life) - අගය එකතු කළ ඉටිපන්දම් සෑදීම සහ මූල්‍ය සාක්ෂරතාවය



යාපනය කෝපායි ප්‍රදේශයේ ගෘහ මූලික කාන්තාවන් 25 දෙනෙකු සඳහා අගය එකතු කළ ඉටිපන්දම් සැකසීම පිළිබඳ දැනුම හා තාක්ෂණය හුවමාරු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 04 වන දින කෝපායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ආරම්භ කරන ලදී. ගෘහ මූලික කාන්තාවන් පස් දෙනෙකුට ඉටිපන්දම් සැකසීම පිළිබඳ අත්දැකීම්, අමුද්‍රව්‍ය සහ ඉටිපන්දම් අච්චු ලබා දෙන ලදී. නල්ලූර් විද්‍යා සම්පත් මධ්‍යස්ථානය විසින් සම්පත් දායකයන් සපයන ලදී. ප්‍රතිලාභීන් විසින් ඔවුන්ගේ ඉටිපන්දම් දේවස්ථාන, සාප්පු සහ වෙළෙඳසැල්වලට අලෙවි කරනු ලබන අතර දේවස්ථානවල භාවිත කරන ලද ඉටිපන්දම්වල පැරඟින් ඉටි ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් නැවත ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රතිලාභීන් හට ලබා දේ.








03. වර්ණවත් දැත් (Coloring Hands) - තල් කොළ අත්කම් නිෂ්පාදනය

මන්නාරම දිස්ත්‍රික්කයේ ගෘහ මූලික කාන්තාවන් 05 දෙනෙකුගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ සහ වර්ණක ද්‍රව්‍ය ලබා දෙමින් ගුණාත්මක තල් නිෂ්පාදන වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරන ලදී. ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා මනා මූල්‍ය කළමනාකරණය, නිෂ්පාදන ඇසුරුම්කරණය සහ අලෙවිකරණය පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 22 දින මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.




04. වර්ණවත් දැත් **(Coloring Hands) -** ඉදල් නිෂ්පාදනය

ඉදල් නිෂ්පාදනය කිරීමේ කුඩා ව්‍යාපාරයක නියැලී සිටින අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් පස් දෙනකුට **(05)** තම ව්‍යාපාරය දියුණු කර ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ස්වයංක්‍රීය කොසු මිටි නිම කිරීමේ යන්ත්‍රයක් ලබා දීම මෙම ව්‍යාපෘතිය හරහා සිදු කෙරිණි. ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා මනා මූල්‍ය කළමනාකරණය, නිෂ්පාදන ඇසුරුම්කරණය සහ අලෙවිකරණය පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය **2023** දෙසැම්බර් **22** දින මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.





4.2 වන්දි සහ මූල්‍යමය සහාය

පාරදෘශ්‍ය ක්‍රියාවලියක් අනුගමනය කරමින් සහ එහි ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පීඩාවට පත් පුද්ගලයින්ට මූල්‍යමය සහන සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. පහත සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සහන ලබා දීම් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නොකඩවා සිදු කරන ලදී-

අ) උතුරු නැගෙනහිර ගැටුම්;
ආ) **2019** පාස්කු ප්‍රහාරය; සහ
ඇ) **2022** දී සිදු වූ සිවිල් කැළඹීම් සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය.

අ) උතුරු නැගෙනහිර ගැටුම – පොරොත්තු අයදුම්පත් සහිත ලිපිගොනු බොහොමයක් අවශ්‍ය ලියකියවිලි නොමැතිව ඉදිරිපත් කර ඇත. නියමිත දිනයක් තුළ ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා අවසන් ලිපියක් නිකුත් කිරීමටත්, ඉන් පසුව ගොනුව වසා දැමීමටත් තීරණය කරන ලදී. අවශ්‍ය ලියකියවිලි ලැබුණු විට මූල්‍යමය සහන ගෙවීම් සකස් කරන අතර අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරන්නේ නම් ගෙවීම සිදු කරනු ලැබේ. උතුරු නැගෙනහිර ගැටුමෙන් පීඩාවට පත් පුද්ගලයින් සම්බන්ධයෙන් ගත් කළ, කුඩා මූල්‍යමය සහනයකට වඩා දිගුකාලීනව හා කල් පවත්නා අර්ථවත් සහන එනම් විශේෂයෙන් ගෘහ මූලික කාන්තාවන් සවිබල ගැන්වීම තුළින් ඔවුන්ගේ අපේක්ෂාවන් ඉහළ නැංවීමේ වැඩසටහන් කෙරෙහි යොමුවිය යුතු බව අවධාරණය කළ යුතුය.

ආ) පාස්කු ප්‍රහාරය, **2019** – ප්‍රතිපත්ති වලට අනුකූලව **2023** වර්ෂයේ දී මූල්‍යමය සහන ප්‍රදානය කරන ලද ප්‍රහාරයෙන් තුවාල ලැබූ එක් විඳිතයෙකුට යටත්ව, සියලු ගෙවීම් සම්පූර්ණ කර ඇති අතර, **2023** දී

පියවීමට හිඟ හිමිකම් කිසිවක් නොතිබුණි. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පූර්ණ ආබාධිත පුද්ගලයින් සමඟ අඛණ්ඩව සම්බන්ධ වී, ඔවුන්ගේ අඛණ්ඩ අවශ්‍යතා සොයා බැලීමට සහ ඒවාට අර්ථවත් ලෙස ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ උපදෙස් - නම් කරන ලද වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් දොළොස් දෙනෙකු (12) විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත්වල[1] 2023 ජනවාරි 12 දිනැති තීරණයට අනුව පහත ක්‍රියාමාර්ග ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත නියෝග කරන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත කරන ලද නියෝග පහත පරිදි වේ-

1. වන්දි වශයෙන් වගඋත්තරකරුවන් විසින් ගෙවීමට නියම කරන ලද මුදල් ගෙවීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ චින්දිත අරමුදලක් පිහිටුවීම.
   වන්දි වශයෙන් නියම කර ඇති මුදල් පහත පරිදි වේ-
   - මෛත්‍රීපාල සිරිසේන, හිටපු ජනාධිපති – රුපියල් මිලියන 100
   - පූජිත් ජයසුන්දර, හිටපු පොලිස්පති – රුපියල් මිලියන 75 යි
   - නිලන්ත ජයවර්ධන, හිටපු අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවය (SIS) – රුපියල් මිලියන 75 කි
   - හේමසිරි ප්‍රනාන්දු, හිටපු ආරක්ෂක ලේකම් – රුපියල් මිලියන 50 යි
   - සිසිර මෙන්ඩිස්, හිටපු ජාතික බුද්ධි ප්‍රධානී (CNI) – රුපියල් මිලියන 10 යි
   - රජය – රුපියල් මිලියන 1
2. වන්දි වශයෙන් නියම කරන ලද මුදල් චින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට සාධාරණ හා අපක්ෂපාතී ලෙස ප්‍රදානය කිරීමට යෝජනා ක්‍රමයක් සකස් කිරීම.
3. විපතට පත් වූවන්ට වන්දි ලබාදීමට ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව අඩුවෙන් ගෙවීම් සහ නොගෙවීම් පිළිබඳව විමර්ශනය කිරීම. (කොළඹ අගරදගුරු තුමාගේ නීති උපදේශකයා විසින් චෝදනා කරනු ලැබුවේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ගෙවීම් සිදු නොවන බවත් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් තත්කාර්ය අන්දමෙන් ගෙවීම් සිදු කරන බවත් ය.)
4. මාධ්‍යවල දැනුම්දීම් මගින් චින්දිත අරමුදලට දායක වීමට නිර්ලෝභී පරිත්‍යාගශීලීන්ට සහ දානපතියන්ට ආරාධනා කිරීම.
5. ගෙවීම් යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රගති වාර්තාවක් සහ ඉහත වගඋත්තරකරුවන් සහ ඕනෑම පරිත්‍යාගශීලියෙකු විසින් සිදු කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර අද සිට මාස 6ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කිරීම.

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත පරිදි වේ -

1. චින්දිත අරමුදල ස්ථාපිත කිරීම: 2023 ජනවාරි 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා බැංකුවේ රාජගිරිය ශාඛාවේ දී චින්දිත අරමුදල ස්ථාපිත කරන ලදී. (ජංගම ගිණුම් අංක 0090167960).
2. වන්දි ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමය: මෙම යෝජනා ක්‍රමය 2023 ජනවාරි 24 වන විට සකස් කර ඇති අතර www.reparations.gov.lk වෙබ් අඩවියේ උඩුගත කරන ලදී.

[1] Supreme Court Case SC FR Application Nos: SC/FR/163/19, SC/FR/165/19, SC /FR/166/19, SC/FR/184/19, SC/FR/188/19, SC/FR/191/19, SC/FR/193/19, SC/FR/195/19, SC/FR/196/19, SC/FR/197/19, SC/FR/198/19, SC/FR/293/19.

3. වින්දිතයින්ට වන්දි මුදල් නොගෙවීම සහ අඩුවෙන් ගෙවීම පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම: සාමාජිකයින් විසින් චෝදනා විමර්ශනය කර **2023** මාර්තු **13** දිනැති සවිස්තර වාර්තාවක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා ගරු නීතිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. පසුව එම වාර්තාව ගරු නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. විමර්ශනයේ සොයාගැනීම් වලට පහත කරුණු අන්තර්ගත විය-
   අ) කිසිදු වින්දිතයෙකු වෙත අඩුවෙන් ගෙවීම් කර නොමැත.
   ආ) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් තත්කාර්ය පදනමක් මත ගෙවීම් සිදු කර නොමැත.
   ඇ) සියලුම ගෙවීම් අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ චක්‍රලේඛවලට අනුව සිදු කර ඇත.
   ඈ) කොළඹ අගරදගුරු තුමාගේ නීති උපදේශකයාගේ කරුණු දැක්වීම්වල සඳහන් වින්දිතයන්ගේ පවුල්වලට අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව රුපියල් මිලියන **1**ක් ලබා දී ඇත.
   හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙබ් අඩවියෙන් මෙම වාර්තාව වෙත ප්‍රවේශ විය හැක.

4. අරමුදලට දායක වීමට පරිත්‍යාගශීලීන්ට ආරාධනා කිරීම: **2023** ජනවාරි **29** වැනි දින පහත සඳහන් පුවත්පත්වල භාෂා තුනෙන්ම දැන්වීම් පළ කරන ලදී - සිළුමිණ, වීරකේසරි, සන්ඩේ ඔබ්සවර්, ලංකාදීප, තිනකරන්, සන්ඩේ ටයිම්ස්. නිවේදනය හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙබ් අඩවියේ ද පළ කර ඇත.


5. ගෙවීම් යෝජනා ක්‍රමය සහ වින්දිතයන්ගේ අරමුදලට ලැබුණු මුදල් පිළිබඳ ප්‍රගති වාර්තා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා ගරු නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.
   මීට අමතරව, පාස්කු බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් අතර සිටින ලබන්නන්ගේ නිර්නාමිකභාවය ආරක්ෂා කරමින්, අරමුදලෙන් කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර හානිපූරණය සඳහා වන කාර්යාලය වෙබ් අඩවියේ යාවත්කාලීන කෙරේ.

ඇ) සිවිල් කැළඹීම් සහ දේශපාලන ප්‍රචණ්ඩත්වය, **2022** – මෙම සිදුවීම් හේතුවෙන් තම නේවාසික දේපළවලට හානි වීමෙන් පාඩු ලැබූවන් ද ඇතුළුව වින්දිතයින්ගෙන් සැලකිය යුතු හිමිකම් ප්‍රමාණයක් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලැබිණි. සියලුම හිමිකම් පියවීමට අවශ්‍ය සියලුම මූල්‍ය ප්‍රතිපාදන හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත නොලැබෙන්නේ යන පදනම මත, ගෙවීම් කිරීමේ දී, නේවාසික පරිශ්‍රවලට අලාභ වූ තැනැත්තන්ට, සහ චංචල දේපළ වලට සිදු වූ අලාභය හේතුවෙන් තම ජීවනෝපාය සම්පූර්ණයෙන්ම අහිමි වූවන්ට ප්‍රමුඛත්වය ලබා දීමට සාමාජිකයින් විසින් තීරණය කළහ. උදා: කුලියට ලබාදුන් බස් රථ

නිවාසවලට හානි වූ තැනැත්තන්ට ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට හැකි වන පරිදි, ප්‍රතිපත්ති මූලධර්ම වලට අනුකූලව හදිසි හානිපූරණ ලබා දෙන ලදී. ලබා දී ඇති මුදල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම් වේ. නිවාස විනාශ වූ හෝ හානි වූ තැනැත්තන්ට ප්‍රමුඛත්වය ලබා දුන් අතර වරින් වර ලබා ගත හැකි මූල්‍ය සම්පත් හැකිතාක් වින්දිතයින් පිරිසකට බෙදා හැරීම සඳහා, අලාභය ලෙස රුපියල් මිලියනයකට වඩා වැඩි මුදලක් ඇස්තමේන්තු කර ඇති අවස්ථා වලදී අර්ධ ගෙවීම් පමණක් සිදු කරන ලදී. මේ ආකාරයට, පිළිගත් කරුණු වලට අනුකූලව, උදාහරණ ලෙස දේපලෙහි හිමිකම, හිමිකරුගේ සාක්ෂි, රක්ෂණයෙන් ගෙවීමක් ලැබුණේ ද යනාදිය, අයදුම්පත් ඉදිරිපත් කළ සියලුම වින්දිතයින්ට යම් සහනයක් ලබා දීමට හැකි විය. කෙසේ වෙතත්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් උතුරු නැගෙනහිර වින්දිතයින්ට සහ **2022** ප්‍රචණ්ඩත්වයට සිදුකරනු ලැබූ ගෙවීම් අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට උත්සාහ කරන ලදී.

2023 වසර තුළදී සහන ලබාදීමට හැකි වූයේ නිශ්චල දේපළ වලට හානි වූ වින්දිතයින්ට පමණි.

2023 දී ලබා දුන් මූල්‍යමය සහන පිළිබඳ සාරාංශය		
අයිතමය		ප්‍රමාණය
01	"පුනරාවර්තන වියදම්" සඳහා මුළු අයවැය ප්‍රතිපාදන	රු. මිලියන 1,555
02	මූල්‍ය සහන සැලසීම සඳහා "පුනරාවර්තන වියදම්" අයවැයෙන් අභ්‍යන්තරව වෙන් කර ඇති මුළු මුදල	රු. මිලියන 1,472
03	සමස්ත පුනරාවර්තන අයවැයේ ප්‍රතිශතයක් ලෙස අභ්‍යන්තර වෙන් කිරීම්	94.67%
04	2023 ජනවාරි 1 වන දිනට හානිපූරණය සඳහා වන කාර්යාලයේ පොරොත්තු ඉල්ලුම්පත්‍ර	8,430
05	2023 දී මූල්‍යමය සහන ලබා දී ඇති අයදුම්කරුවන්- සම්පූර්ණ ගෙවීමක් සිදුකළ අර්ධ ගෙවීමක් සිදුකළ	3,508 1,305 2,203
06	අයදුම්කරුවන්ට ගෙවන ලද මුළු මුදල	රු. මිලියන 1,335
07	2023 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සහ පොරොත්තු පියවීම් සඳහා අනුමත කරන ලද අයදුම්පත්	6,076
08	පොරොත්තු ගෙවීම් පියවීම සඳහා වසර අවසානයේ දී අවශ්‍ය මුදල	රු. මිලියන 1,215



2023 දී සමථයකට පත් කරන ලද සිදුවීම්

4.3 පරිපාලන සහාය

දිස්ත්‍රික් මට්ටමින් පාර්ශ්වකරුවන් සඳහා විශේෂ ජංගම සේවා හරහා පීඩාවට පත් පුද්ගලයින්ට, විශේෂයෙන් උතුරු නැගෙනහිර ගැටුමේ වින්දිතයින්ට අභිමි වූ ලිපි ලේඛන ලබා ගැනීමට හානිපූරණය සඳහා වන කාර්යාලය අඛණ්ඩව සහාය දක්වයි. 2023 දෙසැම්බර් 16 සහ 17 යන දිනවල නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්ක වලදී ජංගම සේවා දෙකක් පවත්වන ලදී.

4.4 මනෝ සමාජීය සහාය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ මනෝ සමාජීය සහාය ඒකකය (PSS ඒකකය) 2022 දී නිල වශයෙන් පිහිටුවන ලදී. හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි මනෝ සමාජීය සහාය සිද්ධි කළමනාකරණ (Psycho-social support Case Manager) වැඩසටහනේ ආරම්භක නියමු අදියරේ ප්‍රතිපෝෂණ ඇගයීමක දී කැපවූ ඒකකයක් ස්ථාපිත කිරීම හඳුනා ගන්නා ලදී. මනෝ සමාජීය ඒකකය 2023 දී පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- සිද්ධි කළමනාකරු ප්‍රවේශය - නියමු අදියර (පසු විපරම්)
- සිද්ධි කළමනාකරු ප්‍රවේශය - I අදියර
- ප්‍රජා සහාය මුලපිරීම

සිද්ධි කළමනාකරු ප්‍රවේශය - නියමු අදියර (පසු විපරම්)

නියමු මුලපිරීමේ පසු විපරමක් සිදු කරන ලද අතර, නව අවශ්‍යතා ඇති නියමු අදියරේ ප්‍රතිලාභීන් අවශ්‍ය සේවාවන් සඳහා සුදුසු පරිදි යොමු කරනු ලැබේ. හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි මනෝ සමාජීය ඒකකය යොමු දත්ත සමුදායක් නිර්මාණය කිරීමෙහි නියැලී සිටින අතර, එමඟින් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සිද්ධි කළමනාකරුවන්ට සහාය වනු ඇත.

සිද්ධි කළමනාකරු ප්‍රවේශය - I අදියර

සිද්ධි කළමනාකරු වැඩසටහනේ පළමු අදියර (නියමු අදියරට පසු) 2023 අප්‍රේල් මාසයේ දී ආරම්භ වූ අතර, දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 23ක් නියෝජනය කරමින් කළමනාකරුවන් 26 දෙනෙකුට පීඩාවට පත් පුද්ගලයන් සහ පවුල් පිළිබඳ සිද්ධීන් 05ක් පමණ පවරා ඇති අතර, විස්තීරණ යොමු කිරීමේ යාන්ත්‍රණයක් හරහා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සිදු කෙරෙනු ඇත.

ප්‍රජා සහාය මුලපිරීම

සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් වැලිකන්ද, පුත්තලම, පූනකරි සහ කිලිනොච්චිය යන ප්‍රදේශයන්හි ගැටුම්/ ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත කම්පනය (ගෘහ මූලික කාන්තාවන්ගේ පවුල් යනාදිය) මගින් පීඩාවට පත් විය හැකි පුද්ගලයන් 15-20 කින් සමන්විත කුඩා කණ්ඩායම් හඳුනා ගැනීමට තෝරාගත් රාජ්‍ය නිලධාරීන් (ජාතික ඒකාබද්ධතා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්) පිරිසකට තාක්ෂණික සහාය ලබා දෙන ලදී. එම කුඩා කණ්ඩායම්වල හැකියාවන් සවිබල ගැන්වීමට සහ ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ප්‍රතිලාභ සැලසෙන ව්‍යාපෘතියක් කිරීම සඳහා ඔවුන්ට මගපෙන්වීම මෙම නිලධාරීන්ගේ වගකීම විය. මනෝ සමාජීය සහාය (PSS) ඒකකයට අනුයුක්ත හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි නිලධාරීන් විසින් මෙම නිලධාරීන් අධීක්ෂණය කරනු ලැබේ. මෙය නියමු වැඩසටහනක් ලෙස 2023 මැයි සිට දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ ඉහත සඳහන් තෝරාගත් දිස්ත්‍රික්කවල ආරම්භ කෙරිණි.

අ/අං	දිස්ත්‍රික්කය	ක්‍රියාකාරකම	වැය වූ මුදල (රු.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	වැලිකන්ද	සෞඛ්‍ය සායනයක් සහ ජීවනෝපාය මධ්‍යස්ථානයක් ප්‍රතිසංස්කරණය කිරීම	**2,353,922.00**	**50**
02	පුත්තලම	අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ළමුන් ඉගෙන ගන්නා පුත්තලමේ පාසලකට බංකු සහ මේස ලබාදීම	**727,000.00**	**55**
03	පූනකරි	කාන්තාවන් 15 දෙනෙකු පුහුණු කිරීම සහ අවශ්‍ය උපකරණ සැපයීම තුළින් ජීවනෝපාය ආධාර යටතේ ඔවුන්ගේ කුඩා පරිමාණ ව්‍යාපාර වැඩිදියුණු කිරීම	**1,615,000.00**	**15**
04	කිලිනොච්චිය	ආබාධිත කාන්තාවන්ගේ වෘත්තීය පුහුණු ආයතනයක භෝජනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල	**5,240,000.00**	**50**

05. මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

5.1 තොරතුරු කළමනාකරණ පද්ධතිය (IMS)

2023 දී, අවධානය යොමු කළ යුතු තීරණාත්මක පැතිකඩ ආමන්ත්‍රණය කරමින් තොරතුරු කළමනාකරණ පද්ධතියේ පුළුල් යාවත්කාලීන කිරීම් සිදු කරනු ලැබිණ. පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම් සහ අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා හඳුනාගත් අවශ්‍යතා අපගේ සේවා සපයන්නන් වෙත ඵලදායී ලෙස සන්නිවේදනය කරන ලද අතර, ඉදිරි දෙවන අදියර සඳහා පසුබිම සකසන ලදී.

පැරණි දත්ත සමුදායේ සිට නව තොරතුරු කළමනාකරණ පද්ධතිය දක්වා දත්ත හුවමාරු කිරීම ද, පද්ධතිය යාවත්කාලීන කිරීම ද සිදු කරමින් පවතින අතර නව මනෝ සමාජීය දත්ත සමුදාය සකසා එය තොරතුරු කළමනාකරණ පද්ධතියට ඒකාබද්ධ කිරීමට ද අපේක්ෂා කෙරේ. එසේම, පද්ධතියේ පැවති දෝෂ ඉවත්කර, පරිශීලකයාට හාවිත කිරීමට පහසු ආකාරයේ පද්ධතියක් බවට එය පත් කිරීමට අවශ්‍ය පසුබිම මේ වනවිට සැකසෙමින් පවතියි.

5.2 කාර්ය මණ්ඩල ධාරිතාව ගොඩනැගීම

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් අරමුදල් සපයන් ලදුව, හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරමින් දින පහක ධාරිතා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- ඵලදායී සන්නිවේදනය සහ ස්ත්‍රී පුරුෂ භාවය (**2023** නොවැම්බර් **17** සිට **18** දක්වා)
- ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය (**2023** දෙසැම්බර් **01**)
- ඵලදායී ආයතනික කුසලතා සහ නායකත්වය (**2023** දෙසැම්බර් **08** සිට **09** දක්වා)

06. විගණන හා කළමනාකරණ කමිටුව

හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික, අසීස් එම්. මුබාරක් මහතාගේ ප්‍රධානත්වයෙන් ත්‍රෛමාසික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී.

07. සාමාන්‍ය විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය විගණනය සිදු කරන ලදී.

08. ලේකම් කාර්යාලය

ලේකම් කාර්යාලයේ ප්‍රධානියා වන්නේ අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරියා සමාලෝචනයට ලක් වූ කාල සීමාව තුළ පහත සඳහන් තැනැත්තන් මෙම තනතුරේ කටයුතු කරන ලදී -

එම්.හසීම් මහතා - 2023 ඔක්තෝබර් 02 දක්වා
ආර්. පී. එස්. සමන්කුමාරි මහත්මිය, අතිරේක ලේකම් (ජාතික ඒකාබද්ධතා), අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - පුරප්පාඩුව පුරවන තෙක් 2023 ඔක්තෝම්බර් 3 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම තනතුරේ කටයුතු කිරීමට පත් කරන ලදී.

ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව පහත පරිදි වේ-

තනතුර	අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල්	01	-
අධ්‍යක්ෂ	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	04	02
පරිපාලන නිලධාරී	01	-
අභ්‍යන්තර විගණක	01	-
හානිපූරණ නිලධාරී	22	09
භාෂා පරිවර්තක	01	01
විගණක සහායක	01	01
කළමනාකරණ සහකාර	30	10
රියදුරු	07	02
කාර්යාල සහායක	07	-
ආරක්ෂක නිලධාරී	01	-
එකතුව	77	25

හානිපූරණ නිලධාරී සහ කළමනාකරණ සහකාර තනතුරුවල සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් පවතින අතර මෙම කාර්යාලයේ කාර්යයන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමට මෙය පැහැදිලි බාධාවකි. 2023 දෙසැම්බර් මාසයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සහකාර අධ්‍යක්ෂ - 01, හානිපූරණ නිලධාරී - 03 සහ කළමනාකරණ සහකාර - 03 පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් පූර්ණ කාලීන උපදේශකයින් තිදෙනෙකුගේ (03) සේවය පහත සඳහන් සේවා ක්ෂේත්‍ර සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලබා දෙන ලදී.

- උපදේශක – සමාජ ඒකාබද්ධතාවය සහ සංහිඳියාව
- උපදේශක – මනෝ සමාජීය සහාය
- උපදේශක – දත්ත පරිපාලනය සහ ව්‍යාප්තිය

09. මූල්‍ය ප්‍රගතියේ සාරාංශය

2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් රු. 1,405,737.00 ක මුදලක් අක් මුදල් වශයෙන් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලැබුණි.

අයිතමය	වෙන් කිරීම (රු.මි.)	ලැබුණු අක්මුදල් ප්‍රමාණය (රු.මි.)	වියදම (රු.මි.)	ලැබුණු අක්මුදල්වල වියදම % ලෙස
වැටුප් සහ වේතන	49	40.82	49.05	120%
වෙනත් පුනරාවර්තන	34	29.41	34.11	116%
මූල්‍යමය සහන ගෙවීම	1,461	1,334.50	1,334.50	100%
වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම්	11		* 9.90	
අතිරේක ප්‍රතිපාදන 2019 පාස්කු ප්‍රහාරයේ වින්දිත අරමුදල (රාජ්‍ය දායකත්වය)	01	01	01	100%
අනු එකතුව	1,556	1,405.74	1,428.67	102%
ප්‍රාග්ධන	1.5		**4.04	
මුළු එකතුව	1,557.50	1,405.74	1,432.71	102%

* සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) වෙතින් ලැබුණු අරමුදල් රු.මිලියන 8.13 සහ රු.මිලියන 1.77 ආරම්භක මුදලෙන් භාවිත කරන ලදී.

** ආරම්භක මුදලෙන් භාවිත කරන අරමුදල්.

10. කෘතඥතාව

හානිපූරණය සඳහා වන කාර්යාලයේ ප්‍රධාන වැඩසටහන් බොහෝ ගණනකට සහාය වීම සඳහා සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයට (IOM) පහසුකම් සලසා දුන් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට, හානිපූරණය සඳහා වන කාර්යාලය සිය හෘදයාංගම ස්තූතිය පළ කර සිටියි.

හානිපූරණය සඳහා වන කාර්යාලයය
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන් අංක	2023 රු.	2022 රු. නැවත ප්‍රකාශ කරන ලද
වත්කම්			
ජංගම වත්කම්			
තොගය - ලිපි දව්‍ය	1	1,636,170	1,195,939
අයවිය යුතු ණය	2	-	4,375,312
සේවක ණය - කෙටි කාලීන	3	1,705,559	2,076,614
ආයෝජන - කෙටි කාලීන	4	82,500,000	222,489,000
සේවක පාරිතෝෂික ආයෝජන	5	27,637,787	22,163,422
අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම්	6	9,978,545	6,660,992
මුදල් සහ මුදල් හා සමාන දෑ	7	8,432,452	48,112,516
		131,890,512	**307,073,794**
ජංගම නොවන වත්කම්			
සේවක ණය	8	7,197,688	7,978,246
දේපළ, පිරියත හා උපකරණ	9	32,636,665	35,540,315
දිගු කාලීන ආයෝජන	10	85,932,713	167,432,713
අස්පෘශ්‍ය වත්කම්	11	1,408,500	1,827,000
		127,175,566	**212,778,274**
මුළු වත්කම්		**259,066,078**	**519,852,068**
බැරකම්			
ජංගම බැරකම්			
වෙනත් ගෙවිය යුතු දෑ	12	3,445,992	2,018,215
විශ්‍රාම වරප්‍රසාද වගකීම	13	862,820	
		4,308,812	**2,018,215**
ජංගම නොවන බැරකම්			
වෙන් කිරීම් සහ වෙනත් බැරකම්	14	22,566,380	269,351,692
විශ්‍රාම වරප්‍රසාද වගකීම	15	14,471,097	15,421,068
		37,037,477	**284,772,760**
මුළු බැරකම්		**41,346,289**	**286,790,976**
ශුද්ධ වත්කම්		**217,719,789**	**233,061,092**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
කාල සීමාව සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය		216,994,393	202,665,092
ප්‍රතිඅගණන සංචිත		725,396	30,396,000
සමුච්චිත අරමුදල		**217,719,789**	**233,061,092**

සහතික කිරීම.

2023 දෙසැම්බර් 31 දිනට ඉහත මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බවත්,
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ශුද්ධ අතිරික්තය/ඌනතාවය අප විසින් සහතික කරමු.

.....
එස්.එන්.සී.ඩබ්ලිව්.එම්. ධර්මකීර්ති නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

.....
ජේ.ක්‍රිෂ්ණමූර්ති අධ්‍යක්ෂ ජනරාල්

මෙකී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම හානිපූරණය සඳහා වන කාර්යාලයය සාමාජික මණ්ඩලය සතු වගකීම කි. හානිපූරණය සඳහා වන කාර්යායාලයයේ සාමාජික මණ්ඩලය සහ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා මෙකී මූල්‍ය ප්‍රකාශන අනුමත කරමි.

.....
ධාරා විජයතිලක සභාපතිනි

.....
ආචාර්යය ඒ. එම්. මුබාරක් සාමාජික

හානිපූරණය සඳහා වන කාර්යාලයය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

		2023	2022
		රු.	රු.
			නැවත ප්‍රකාශ කරන ලද
ආදායම	**සටහන්**		
හුවමාරු නොවන ගනුදෙනු තුළින් වන ආදායම			
පුනරාවර්තන ප්‍රදාන	16	1,405,737,000	480,530,000
		1,405,737,000	**480,530,000**
ප්‍රාග්ධන ප්‍රදාන		2,732,634	350,600
හුවමාරුවන ගනුදෙනු තුළින් වන ආදායම		**8,798,334**	**6,138,882**
පොළී	17	8,796,934	6,135,732
වෙනත් අයභාර	18	1,400	3,150
මුළු ආදායම		**1,417,267,968**	**487,019,482**
මෙහෙයුම් ප්‍රතිඵලය			
පුනරාවර්තන ආදායම්			
හුවමාරු නොවන ගනුදෙනු තුළින් වන ආදායම		1,405,737,000	480,530,000
හුවමාරු වන ගනුදෙනු තුළින් වන ආදායම		8,798,334	6,138,882
එකතුව		**1,414,535,334**	**486,668,882**

අඩුකලා - පුනරාවර්තන වියදම්

වැටුප්, වේතන සහ සේවක වරප්‍රසාද	19	(49,353,550)	(49,134,061)
ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම	20	(1,337,276,795)	(406,000,062)
වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්	21	(328,096)	(693,026)
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	22	(3,970,807)	(2,860,864)
ස්ථාවර වත්කම් නඩත්තුව	23	(5,716,466)	(4,482,218)
වෙනත් වියදම්	24	(24,813,760)	(33,056,870)
අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ/(පාඩු)	25	(116,083)	(4,411)
ක්ෂයවීම්	26	(9,641,762)	(1,497,029)
ක්‍රමක්ෂය	27	(418,500)	(418,500)
මුළු පුනරාවර්තන වියදම්		**(1,431,635,819)**	**(498,147,041)**
කාල සීමාව සඳහා වත්මන් පුනරාවර්තන අතිරික්තය / ඌනතාවය		**(17,100,485)**	**(11,478,159)**
විස්තීරණ ආදායම් - 2023 වර්ෂය සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තය		725,396	30,396,000
හුවමාරු නොවන ගනුදෙනු තුළින් ලබන ආදායම			
ප්‍රාග්ධන ප්‍රදාන		2,732,634	350,600
හානිකරන අලාභ වලට අදාළ වියදම්		-	-
ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණයෙන් පසු කාලය සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය		**(13,642,455)**	**19,268,441**

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
සඳහා සටහන්

2022 (රු.)	සටහන්		2023 (රු.)
		වත්කම්	
1,195,938.65	**1**	**තොගය**	**1,636,170.25**
1,155,888.65		තොග (ලිපි ද්‍රව්‍ය) - උපලේඛන iii	1,592,620.25
40,050.00		තොග (සුභ සාධක) - උපලේඛන iii	43,550.00
4,375,312.36	**2**	**අයවිය යුතු ණය**	**-**
4,375,312.36		රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	-
		අඩු කළා : වෙන් කිරීම්	
		අඩමාන ණය සඳහා වෙන් කිරීම්	
(4,375,312.36)		රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	-
-		2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
2,076,613.80	**3**	**සේවක ණය - කෙටි කාලීන**	**1,705,558.80**
164,922.48		දේපළ ණය - උපලේඛන i	164,922.48
1,857,941.32		ආපදා ණය - උපලේඛන i	1,498,136.32
-		විශේෂ අත්තිකාරම් - උපලේඛන i	-
53,750.00		උත්සව අත්තිකාරම් - උපලේඛන i	42,500.00
222,489,000.00	**4**	**කෙටි කාලීන ආයෝජන**	**82,500,000.00**
222,489,000.00		ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්	82,500,000.00
		(විස්තර සඳහා සටහන් අංක 13 - 1 බලන්න)	
22,163,421.57	**5**	**සේවක පාරිතෝෂික ආයෝජන**	**27,637,786.69**
22,163,421.57		සේවක පාරිතෝෂික ආයෝජන	27,637,786.69

6,660,991.73	**6**	**අත්තිකාරම්,ගෙවීම් සහ වෙනත් ලැබීම්**	**9,978,544.65**
4,162,232.42		ණයදෙන ආයතනවලින් ලැබිය යුතු සේවා ගාස්තු	-
15,787.64		පාරිතෝෂික ආයෝජන ලැබිය යුතු පොලී	-
686,109.36		අයවිය යුතු ලැබීම් - උපලේඛන vii	9,458,357.46
211,708.41		පෙර - ගෙවුම් - උපලේඛන iv	495,287.19
737,485.32		උපචිත ලැබීම් - උපලේඛන ix	19,400.00
847,668.58		ආපසු අයකර ගත හැකි තැන්පතු උපලේඛන v	5,500.00
48,112,516.37	**7**	**මුදල් හා මුදල් සමාන දෑ**	**8,432,451.91**
		උපලේඛන vi	
47,797,232.33		ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක-2026495	8,432,451.91
315,284.04		ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක-2026496	-
7,978,245.81	**8**	**සේවක ණය**	**7,197,688.15**
1,250,612.37		දේපළ ණය - උපලේඛන i	1,085,689.89
6,714,833.44		ආපදා ණය - උපලේඛන i	6,094,648.26
2,800.00		විශේෂ අත්තිකාරම් - උපලේඛන i	3,600.00
10,000.00		උත්සව අත්තිකාරම් - උපලේඛන i	13,750.00
35,540,315.04	**9**	**දේපළ, පිරියත හා උපකරණ**	**32,636,664.77**
		පිරිවැය	
48,291,687.28		වර්ෂයේ ආරම්භක දිනට අගය	48,535,605.57
44,496.00		වර්ෂය තුළ එකතු කිරීම්	3,185,914.56
		ජ'නර්ල් සටහන් අංක . 02	
-		**එකතු කළා** - නො. 40, රාජගිරිය කාර්යාලය ගොඩනැගිල්ල කාමර බෙදා වෙන් කිරීම ගිණුමට ගලපන ලද පිරිවැය	858,600.00
		ජ'නර්ල් සටහන් අංක . 13	
350,600.00		**එකතු කළා** - අමාත්‍යාංශයෙන් ලද පරිත්‍යාගවල පිරිවැය වායු සමීකරණ 21	2,438,637.50
		ජ'නර්ල් සටහන් අංක . 22	
-		**එකතු කළා** - අමාත්‍යාංශයෙන් ලද පරිත්‍යාගවල පිරිවැය ලී බඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම අයිතම 18	293,996.62

	ජ'නර්ල් සටහන් අංක . 25	
-	**අඩු කළා** - අපහරණය කරන ලද වායු සමීකරණ පිරිවැය / ප්‍රතතගණිත අගය	(400,000.00)
	ජ'නර්ල් සටහන් අංක . 26	
-	**අඩු කළා** - අපහරණය කරන ලද කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම පිරිවැය නො. 408 ගොඩනැගිල්ල	(2,286,656.80)
	ජ'නර්ල් සටහන් අංක . 34	
(30,092,750.21)	**අඩු කළා** - ප්‍රතතගණනය කරන ලද වත්කම්වල පිරිවැය / ප්‍රතතගණිත අගය	(5,836,989.39)
	ජ'නර්ල් සටහන් අංක . 35	
30,396,000.00	**එකතු කළා** - ප්‍රතතගණිත වත්කම්වල වටිනාකම	3,694,500.00
	ජ'නර්ල් සටහන් අංක . 38	
(420,267.50)	**අඩු කළා** - 2021 සහ 2022 වසරවල අපහරණය කරන ලද වත්කම්වල පිරිවැය / ප්‍රතතගණිත අගය	(992,816.00)
	ජ'නර්ල් සටහන් අංක . 40	
(34,160.00)	**අඩු කළා** - අපහරණය කරන ලද හඳුනා ගත නො හැකි පරිගණක වත්කම්වල පිරිවැය / ප්‍රතතගණිත අගය	(1,575,214.00)
48,535,605.57		**47,915,578.06**
	ක්ෂයවීම්	
42,027,397.97	වර්ෂයේ ආරම්භක දිනට අගය	12,995,290.53
1,461,968.77	**එකතු කළා** - වර්ෂය සඳහා ක්ෂයවීම්	9,002,702.71
	ජ'නර්ල් සටහන් අංක . 21	
-	**එකතු කළා** - අමාත්‍යාංශයෙන් ලද පරිත්‍යාගවල ක්ෂය වායු සමීකරණ 21	609,659.38
	ජ'නර්ල් සටහන් අංක . 24	
35,060.00	**එකතු කළා** - අමාත්‍යාංශයෙන් ලද පරිත්‍යාගවල ක්ෂය ලී බඩු, කාර්යාල උපකරණ සහ සවිකිරීම අයිතම 18	29,399.66
	ජ'නර්ල් සටහන් අංක . 31	
	අඩු කළා - අපහරණය කරන ලද වායු සමීකරණ යන්ත්‍ර - ක්ෂය	(100,000.00)

		ජ'නර්ල් සටහන් අංක . 32	
-		**අඩු කළා** - අපහරණය කරන ලද කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම - ක්ෂය නො. 408 ගොඩනැගිල්ල	(1,750,216.98)
		ජ'නර්ල් සටහන් අංක . 37	
(30,092,750.21)		**අඩු කළා** - ප්‍රතිගණනය කරන ලද වත්කම්වල ක්ෂය වෙන් කිරීම්	(2,867,884.89)
		ජ'නර්ල් සටහන් අංක . 39	
(409,058.00)		**අඩු කළා** - අපහරණය කරන ලද වත්කම්වල ක්ෂය වෙන් කිරීම්	(931,380.92)
		ජ'නර්ල් සටහන් අංක . 41	
(27,328.00)		**අඩු කළා** - අපහරණය කරන ලද හඳුනා ගත නො හැකි පරිගණක වත්කම්වල - ක්ෂය වෙන් කිරීම්	(1,708,656.20)
12,995,290.53		වර්ෂයේ අවසාන දිනට අගය	**15,278,913.29**
35,540,315.04		වර්ෂයේ අවසාන දිනට අගය	**32,636,664.77**
		(විස්තර සඳහා සටහන් අංක 12 - 1 බලන්න)	
167,432,712.63	**10**	**දිගු කාලීන ආයෝජන**	**85,932,712.63**
167,432,712.63		ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්	85,932,712.63
		(විස්තර සඳහා සටහන් අංක 13 - 1 බලන්න)	
1,827,000.00	**11**	**අස්පෘශ්‍ය වත්කම්**	**1,408,500.00**
		පිරිවැය	
2,245,500.00		වර්ෂයේ ආරම්භක දිනට අගය	1,827,000.00
		වර්ෂය තුළ එකතු කිරීම්	-
		ක්‍රමක්ෂය	
		වර්ෂයේ ආරම්භක දිනට අගය	-
418,500.00		**එකතු කළා- වර්ෂය සඳහා ක්‍රමක්ෂය**	418,500.00
418,500.00		වර්ෂයේ අවසාන දිනට අගය	**418,500.00**
		ඉදිරියට ගෙන ආ අගය	
1,827,000.00		වර්ෂයේ අවසාන දිනට අගය	**1,408,500.00**
		(විස්තර සඳහා සටහන් අංක 12 - 1 බලන්න	
519,852,067.96		**මුළු වත්කම්**	**259,066,077.85**

2022 (රු.)	සටහන්		2023 (රු.)
2,018,215.33	**12**	**වෙනත් ගෙවිය යුතු දෑ**	**3,445,992.13**
1,141,992.49		උපචිත වියදම් - උපලේඛන viii	1,869,769.29
261,222.84		තැන්පතු ගිණුම	261,222.84
615,000.00		විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	1,315,000.00
-	**13**	**විශ්‍රාම වරප්‍රසාද වගකීම**	**862,820.00**
-		විශ්‍රාම වරප්‍රසාද වගකීම (උපලේඛන - xi)	862,820.00
269,351,692.36	**14**	**වෙන් කිරීම් සහ වෙනත් බැරකම්**	**22,566,380.00**
264,976,380.00		ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය දීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ අරමුදල්	22,566,380.00
4,375,312.36		අඩමාන ණය සඳහා වෙන් කිරීම් රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	-
15,421,068.00	**15**	**විශ්‍රාම වරප්‍රසාද වගකීම**	**14,471,097.00**
15,421,068.00		විශ්‍රාම වරප්‍රසාද වගකීම (උපලේඛන - xi)	14,471,097.00
286,790,975.69		**මුළු බැරකම්**	**41,346,289.13**
233,061,092.27		**ශුද්ධ වත්කම්**	**217,719,788.72**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සඳහා සටහන්

2022 (රු.)	සටහන්		2023 (රු.)
		ආදායම	
480,530,000.00	**16**	**අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් සංක්‍රාම ගෙවීම්**	**1,405,737,000.00**
406,000,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වන්දි	1,335,500,000.00
37,020,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වැටුප්	40,820,000.00
37,510,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වෙනත් පුනරාවර්තන	29,417,000.00
6,135,732.14	**17**	**පොළී**	**8,796,933.55**
		ණයදෙන ආයතනවල ආයෝජනවලින්හෝවා ගාස්තු	
310,000.00		ලංකා බැංකුව	166,438.36
150,000.00		මහජන බැංකුව	30,410.95
200,000.00		රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	42,739.73
2,516,526.86		ලංකා බැංකුව - ස්වයං රැකියා - නව	1,829,040.14
985,705.56		ලංකා බැංකුව - නිවාස - නව	886,993.23
1,523,178.61		පාරිතෝෂික ආයෝජන - නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	5,458,577.48
		සේවක ණය සඳහා පොළී	
85,698.51		දේපළ ණය	49,243.95
361,554.48		ආපදා ණය	329,085.71
3,068.12		විශේෂ අත්තිකාරම්	4,404.00
3,150.00	**18**	**වෙනත් අයභාර**	**1,400.00**
3,150.00		වෙනත් අයභාර	1,400.00
486,668,882.14		**මුළු ආදායම**	**1,414,535,333.55**

වියදම්

49,134,060.79	**19**	**පෞද්ගලික පඩිනඩි**	**49,353,550.07**
24,045,536.86		කාර්යය මණ්ඩල වැටුප්	23,963,988.82
-		ද්විතීයන පදනම නිලධාරී - ණය පොළී	25,514.88
3,449,442.48		සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල්	3,470,459.09
863,154.62		සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල්	867,614.79
703,801.36		අතිකාල සහ නිවාඩු දින වැටුප්	932,118.08
1,148,537.90		වෙනත් දීමනා	1,520,560.46
4,884,842.25		ජීවන වියදම් දීමනාව	4,744,756.81
218,530.74		භාෂා දීමනාව	181,860.84
22,500.00		අන්තර් දීමනාව	9,583.33
18,000.00		දිරි දීමනාව	18,000.00
335,032.26		වෘත්තීය දීමනාව	327,591.39
1,146,774.19		වාහන කුලිය	355,806.44
1,824,159.52		ඉන්ධන දීමනාව	1,837,401.31
1,215,000.00		සභාපතිනී දීමනාව	1,620,000.00
3,378,000.00		සාමාජික දීමනාව	4,320,000.00
638,333.33		ගමන් වියදම් දීමනාව	1,200,000.00
296,950.00		දුරකථන දීමනාව	378,000.00
220,182.58		වැන්දඹු හා අනත්දරු විශ්‍රාම දායකත්වය	81,670.00
3,121,631.70		අතිරේක දීමනාව	2,996,372.33
84,000.00		විගණන කමිටු සාමාජික දීමනාව	72,000.00
1,519,651.00		පාරිතෝෂික දීමනාව	430,251.50
406,000,061.69	**20**	**ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම**	**1,337,276,795.44**
		මරණ හා තුවාල වන්දි	
130,000.00		රජයේ නිලධාරීන්	450,000.00
31,057,500.00		සාමාන්‍ය මහජන	18,865,000.00
1,925,000.00		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21	3,500,000.00
-		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21 - විත්දිතයින් සඳහා වූ අරමුදල ESCROW Account	1,000,000.00
325,000.00		පාස්කු ප්‍රහාරයට පසු සිදුවීම 2019	-
23,400,000.00		අතුරුදහන්වූවන් - අතුරුදහන්වූවන්ගේ කාර්යාලයය	41,200,000.00

හානියට පත් දේපළ සඳහා වන්දි

19,092,000.00		රජයේ නිලධාරීන්	14,900,000.00
286,978,338.00		සාමාන්‍ය මහජන	496,809,702.00
26,170,520.00		පූජනීය ස්ථාන	-
15,531,944.00		මහනුවර සිදුවීම 2018 16/2018	5,815,128.00
-		2022 සිදුවීම	752,739,120.00
17,000.00		පාස්කු ප්‍රහාරයට පසු සිදුවීම 2019	127,515.00
665,810.00		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21	97,690.00
-		**ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම**	
226,543.69		මනෝ සමාජීය සහය	1,772,640.44
480,406.00		ජීවනෝපාය ආධාර වැඩසටහන	-
693,026.46	**21**	**වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්**	**328,096.00**
252,499.00		ස්වයං රැකියාලාභී පුහුණු වැඩසටහන	291,981.00
440,527.46		වන්දි ප්‍රදානය කිරීමේ උත්සව කටයුතු සහ ජංගම සේවා	36,115.00
2,860,863.65	**22**	**සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය**	**3,970,806.69**
1,384,953.87		ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	1,976,358.69
1,380,499.78		ඉන්ධන හා ලිහිසි තෙල්	1,937,548.00
57,000.00		නිල ඇඳුම්	56,900.00
38,410.00		පුවත්පත් සහ සඟරා	-
4,482,218.11	**23**	**ස්ථාවර වත්කම් නඩත්තුව**	**5,716,465.78**
867,282.85		ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව	1,198,681.44
1,470,891.24		වාහන අලුත්වැඩියාව හා නඩත්තුව	1,606,220.15
2,144,044.02		ගොඩනැගිල්ල නඩත්තු වියදම්	2,911,564.19
33,056,870.02	**24**	**වෙනත් වියදම්**	**24,813,760.12**
51,400.00		ගමන් වියදම් - දේශීය	16,000.00
464,064.29		දුරකථන ගාස්තු	525,929.08
309,000.00		තැපැල් ගාස්තු	551,550.00
2,389,689.48		විදුලිය බලය සහ අනෙකුත් පහසුකම්	3,016,974.06
22,377,622.38		ගොඩනැගිලි කුලිය	11,563,218.42
614,700.00		විගණන ගාස්තු	700,000.00

		වෙනත් වියදම්	
654,400.00		මුද්‍රණ හා ප්‍රචාරණ ගාස්තු	919,615.00
15,000.00		නීති ගාස්තු - නඩු අංක 5961	20,000.00
1,860,381.37		සේවකයන් සඳහා වෛද්‍ය රක්ෂණ	1,770,050.88
214,420.82		සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම්	83,548.32
935,189.68		සුභ සාධක වියදම්	1,722,739.00
499,002.00		විවිධ වියදම්	1,135,385.36
2,672,000.00		මෙහෙයුම් කල්බදු වියදම	2,788,750.00
4,411.50	**25**	**අපහරණය කරන ලද වත්කම් ආදායම**	**116,082.70**
4,411.50		අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද අලාභ	116,082.70
1,497,028.77	**26**	**ක්ෂයවීම්**	**9,641,761.75**
832,678.43		ක්ෂය - ලී බඩු, කාර්යාල උපකරණ හා සවි කිරීම්	857,589.28
129,591.00		ක්ෂය - යන්ත්‍ර හා පිරියත	281,464.36
-		ක්ෂය - රථ වාහන	6,772,500.00
61,310.20		ක්ෂය - දුරකථන	61,310.20
275,216.98		ක්ෂය -කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම	320,452.02
98,232.16		ක්ෂය - පරිගණක	738,786.51
100,000.00		ක්ෂය - වායු සමීකරණ	609,659.38
418,500.00	**27**	**ක්‍රමක්ෂය**	**418,500.00**
418,500.00		පරිගණක දත්ත පද්ධතිය	418,500.00
498,147,040.99		**මුළු පුනරාවර්තන වියදම්**	**1,431,635,818.55**
(11,478,158.85)		**කාල සීමාව සඳහා වත්මන් පුනරාවර්තන අතිරික්තය / ඌනතාවය**	**(17,100,485.00)**
30,396,000.00		විස්තීරණ ආදායම් - වර්ෂය සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තය	**725,395.50**
350,600.00		ප්‍රාග්ධන ප්‍රදාන	**2,732,634.00**
19,268,441.15		**ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණයෙන් පසු කාලය සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය**	**(13,642,455.50)**

හානිපූරණය සඳහා වන කාර්යාලයය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	සටහන්	2023 (රු.)	2022 (රු.)
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්			
මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල්		1,405,737,000	480,530,000
විවිධ ආදායම් හා වෙනත් ලැබීම්		1,400	3,150
වත්කම් අපහරණය කිරීමෙන් ලද ආදායම		628,950	14,230
වෙනත් පුනරාවර්තන වියදම්	ඒ	(1,428,578,876)	(477,337,158)
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(22,211,526)**	**3,210,222**
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
පොළී ආදායම	බී	7,500,588	6,779,360
ණය අයකර ගැනීම් සහ වෙනත්	සී	72,310,203	16,221,096
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	ඩී	(4,044,515)	(44,496)
කල් පිරුණු ආයෝජන ආපසු ලැබීම්	ඊ	221,489,000	114,989,000
ආයෝජන හා වෙනත්	එෆ්	(314,723,816)	(115,450,968)
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ		**(17,468,539)**	**22,493,992**
මූල්‍යමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය		-	-
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		-	-
මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ වැඩිවීම/අඩුවීම		**(39,680,064)**	**25,704,214**
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	ජී	**48,112,516**	**22,408,301**
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	එච්	**8,432,452**	**48,112,516**

* ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

		2023 (රු.)	2022 (රු.)
ඒ	**වෙනත් පුනරාවර්තන වියදම්**	**(1,428,578,875.59)**	**(477,337,157.58)**
	පෞද්ගලික පඩිනඩි	(49,055,109.24)	(47,871,573.84)
	ගමන් වියදම්	(15,200.00)	(105,411.00)
	සැපයුම්	(4,520,438.29)	(3,320,637.90)
	නඩත්තුව	(6,099,182.53)	(4,980,054.66)
	ගිවිසුම්ගත සේවා	(18,460,675.73)	(10,786,615.77)
	වෙනත් පුනරාවර්තන වියදම්	(4,693,525.36)	(3,563,194.26)
	වෙනත් හානිපූරණයන් සඳහා ප්‍රදාන	(9,901,362.44)	(706,949.69)
	මරණ / තුවාල වන්දි	(65,015,000.00)	(56,837,500.00)
	හානියට පත් දේපළ සඳහා වන්දි	(1,270,489,155.00)	(348,455,612.00)
	වන්දි සඳහා වෙනත් වියදම්	(329,227.00)	(709,608.46)
බී	**පොළී ආදායම**	**7,500,588.49**	**6,329,039.31**
	2021 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද සේවා ගාස්තු	-	6,329,039.31
	2022 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද සේවා ගාස්තු	4,162,232.42	-
	2023 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද සේවා ගාස්තු	2,955,622.41	-
	සේවක ණයවලින් ලද පොළී		
	ආපදා ණය	329,085.71	361,554.48
	දේපළ ණය	49,243.95	85,698.51
	විශේෂ අත්තිකාරම්	4,404.00	3,068.12
සී	**ණය අයකර ගැනීම් සහ වෙනත්**	**72,310,203.12**	**16,221,095.91**
	උත්සව අත්තිකාරම්	357,500.00	326,250.00
	ආපදා ණය	2,663,222.18	2,039,800.31
	දේපළ ණය	164,922.48	1,069,625.70
	විශේෂ අත්තිකාරම්	127,200.00	84,000.00
	හිමිකම් නොපාන ලද වන්දි	8,711,233.00	11,511,883.00
	විවිධ තැන්පතු	1,153,828.46	1,189,536.90
	විවිධ අත්තිකාරම්	2,765,013.00	-
	මුදල් නොවූ චෙක්පත්	56,367,284.00	-

ඩී	**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම**	**(4,044,514.56)**	**(44,496.00)**
	ලී බඩු කාර්යාල උපකරණ හා සවිකිරීම්	(83,315.00)	(44,496.00)
	කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම	(1,008,417.06)	-
	වායු සමීකරණ	(753,652.50)	-
	පරිගණක	(2,199,130.00)	-
ඊ	**කල් පිරුණු ආයෝජන ආපසු ලැබීම්**	**221,489,000.00**	**240,500,000.00**
	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	**11,000,000.00**	**12,000,000.00**
	2023 පෙබරවාරි 24	1,000,000.00	-
	2023 මාර්තු 23	1,000,000.00	-
	2022 මාර්තු 29	-	2,000,000.00
	2022 අප්‍රේල් 21	-	1,000,000.00
	2023 මැයි 19	2,000,000.00	-
	2023 ජූනි 13	1,000,000.00	-
	2022 ජූනි 27	-	1,000,000.00
	2023 ජූලි 04	1,000,000.00	-
	2022 ජූලි 20	-	1,000,000.00
	2023 අගෝස්තු 14	1,000,000.00	-
	2023 සැප්තැම්බර් 01	1,000,000.00	-
	2022 සැප්තැම්බර් 16	-	1,000,000.00
	2022 සැප්තැම්බර් 23	-	1,000,000.00
	2023 ඔක්තෝම්බර් 09	1,000,000.00	-
	2022 ඔක්තෝම්බර් 12	-	1,000,000.00
	2022 ඔක්තෝම්බර් 25	-	1,000,000.00
	2022 නොවැම්බර් 25	-	1,000,000.00
	2022 දෙසැම්බර් 19	-	2,000,000.00
	2023 දෙසැම්බර් 20	2,000,000.00	-
ඊ	**කල් පිරුණු ආයෝජන ආපසු ලැබීම්**		
		210,489,000.00	**102,989,000.00**

ලංකා බැංකුව		
2022 ජනවාරි 04 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය -1%	-	50,000,000.00
2023 පෙබරවාරි 20 - ලංකා බැංකු නිවාස ණය යෝජනා ක්‍රමය - 1%	6,908,000.00	-
2023 පෙබරවාරි 20 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය -1%	33,000,000.00	-
2022 අප්‍රේල් 07 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය -1%	-	20,487,000.00
2023 ජූලි 06 - ලංකා බැංකු නිවාස ණය යෝජනා ක්‍රමය - 1%	5,581,000.00	-
2022 ජූලි 27 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	-	5,000,000.00
2022 ජූලි 27 - ලංකා බැංකු කර්මාන්ත ණය යෝජනා ක්‍රමය - 2.5%	-	6,000,000.00
2022 අගෝස්තු 08 - ලංකා බැංකු නිවාස ණය යෝජනා ක්‍රමය - 1%	-	581,000.00
2023 සැප්තැම්බර් 06 - ලංකා බැංකු කර්මාන්ත ණය යෝජනා ක්‍රමය - 2.5%	10,000,000.00	-
2022 ඔක්තෝම්බර් 27 - ලංකා බැංකු නිවාස ණය යෝජනා ක්‍රමය -1%	-	921,000.00
2022 ඔක්තෝම්බර් 27 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය1%	-	20,000,000.00
2023 නොවැම්බර් 03 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	35,000,000.00	-
2022 දෙසැම්බර් 07 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	100,000,000.00	-
මහජන බැංකුව		
2023 මාර්තු 21 - මහජන බැංකව - නිවාස ණය යෝජනා ක්‍රමය - 1.5%	10,000,000.00	-
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව		
2023 ජුනි 01 - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - නිවාස ණය යෝජනා ක්‍රමය - 2%	9,453,888.24	-

2023 ජුනි 22 - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - නිවාස ණය යෝජනා ක්‍රමය - 2%	546,111.76	-
එෆ් ආයෝජන හා වෙනත්	**(314,723,815.92)**	**(115,450,967.86)**
කල් පිරුණු ආයෝජන මහා භාණ්ඩාරය වෙත ආපසු යැවීම	**(242,410,000.00)**	**(94,068,000.00)**
2022 ජනවාරි 25 - ලංකා බැංකුව	-	50,000,000.00
2023 මාර්තු 22 - ලංකා බැංකුව	39,908,000.00	-
2023 මාර්තු 27 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,000,000.00	-
2023 මාර්තු 27 - මහජන බැංකුව	10,000,000.00	-
2023 අප්‍රේල් 12 - ලංකා බැංකුව	921,000.00	-
2022 අප්‍රේල් 25 - ලංකා බැංකුව	-	20,487,000.00
2023 මැයි 29 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	2,000,000.00	-
2022 මැයි 31 - ලංකා බැංකුව	-	6,000,000.00
2022 මැයි 31 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	3,000,000.00
2023 ජුනි 15 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	2,000,000.00	-
2023 ජුනි 28 - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	10,000,000.00	-
2023 ජූලි 06 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,000,000.00	-
2023 ජූලි 17 - ලංකා බැංකුව	5,581,000.00	-
2022 ජූලි 26 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	2,000,000.00
2022 ජූලි 29 - ලංකා බැංකුව	-	5,000,000.00
කල් පිරුණු ආයෝජන මහා භාණ්ඩාරය වෙත ආපසු යැවීම		
2023 අගෝස්තු 17 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,000,000.00	-
2022 අගෝස්තු 23 - ලංකා බැංකුව	-	581,000.00
2023 සැප්තැම්බර් 14 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,000,000.00	-

	2023 සැප්තැම්බර් 14 - ලංකා බැංකුව	10,000,000.00	-
	2022 සැප්තැම්බර් 28 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	2,000,000.00
	2023 ඔක්තෝම්බර් 09 - ලංකා බැංකුව	20,000,000.00	-
	2023 ඔක්තෝම්බර් 09 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1,000,000.00	
	2022 නොවැම්බර් 07 - ලංකා බැංකුව	35,000,000.00	-
	2022 නොවැම්බර් 31 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	2,000,000.00
	2022 දෙසැම්බර් 06 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	1,000,000.00
	2023 දෙසැම්බර් 22 - ලංකා බැංකුව	100,000,000.00	-
	2022 දෙසැම්බර් 29 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	-	2,000,000.00
	2023 දෙසැම්බර් 29 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	2,000,000.00	-
එෆ්	**ආයෝජන හා වෙනත්**	**(72,313,815.92)**	**(21,382,967.86)**
	උත්සව අත්තිකාරම්	(350,000.00)	(350,000.00)
	ආපදා ණය	(1,683,232.00)	(1,683,521.00)
	විශේෂ අත්තිකාරම්	(128,000.00)	(84,000.00)
	හිමිකම් නො පාන ලද වන්දි	(8,711,233.00)	(18,075,909.96)
	විවිධ තැන්පතු	(1,153,828.46)	(1,189,536.90)
	විවිධ අත්තිකාරම්	(2,883,271.98)	-
	රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන	(1,036,966.48)	-
	මුදල් නො වූ චෙක්පත්	(56,367,284.00)	-
ජී	**කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ**	**48,112,516.37**	**22,408,301.48**
	ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495	47,797,232.33	22,093,017.44
	ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496	315,284.04	315,284.04
	ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම් අංක 74757297	-	-
එච්	**කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ**	**8,432,451.91**	**48,112,516.37**
	ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495	8,432,451.91	47,797,232.33
	ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496		315,284.04

හානිපූරණය සඳහා වන කාර්යාලයය - ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	කාල සීමාව සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය		ප්‍රත්‍යභඥාන සංචිත		රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		සමුච්චිත අරමුදල	
	2023	2022	2023	2022	2023	2022	2023	2022
වර්ෂයේ ජනවාරි 01 දිනට ශේෂය	**232,024,126**	**213,983,914**			**1,036,966**	-	**233,061,092**	**213,983,914**
වර්ෂයට අදාළ ගැලපුම් - ජර්නල් අංක 03	(112,900)	(122,775)					(112,900)	(122,775)
වර්ෂයට අදාළ ගැලපුම් - ජර්නල් අංක 14	(300,000)						(300,000)	-
වසර තුළ - මහා භාණ්ඩාගාරය වෙත යැවීම්					(1,036,966)		(1,036,966)	-
වර්ෂය සඳහා වියදම්	(248,982)	(68,487)					(248,982)	(68,487)
විස්තීරණ ආදායම් - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	2,732,634	350,600					2,732,634	350,600
කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය /ඌනතාවය	(17,100,485)	(11,478,159)	725,396	30,396,000	-	-	(16,375,089)	18,917,841
වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය	**216,994,393**	**202,665,092**	**725,396**	**30,396,000**	**-**	**-**	**217,719,789**	***233,061,092***

ජංගම නොවන වත්කම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 12-1

	රථ වාහන	ලී බඩු, කාර්යාල උපකරණ සහ සවි කිරීම්	යන්ත්‍ර හා පිරියත	දුරකථන	කැමරා බෙදා වෙන් කිරීම	පරිගණක	වායු සමීකරණ	පරිගණක දත්ත පද්ධතිය	එකතුව
පිරිවැය 2023.01.01 දිනට ශේෂය	**27,090,000.00**	**9,127,973.62**	**1,142,543.24**	**1,491,959.76**	**2,286,656.80**	**6,996,472.15**	**400,000.00**	**1,827,000.00**	**48,535,605.57**
වර්ෂය තුළ එකතු කිරීම්		83,315.00			149,817.06	2,199,130.00	753,652.50		**3,185,914.56**
ජ'නර්ල් අංක 02					858,600.00				**858,600.00**
ජ'නර්ල් අංක 19							2,438,637.50		**2,438,637.50**
ජ'නර්ල් අංක 22		293,996.62							**293,996.62**
ජ'නර්ල් අංක 25							(400,000.00)		**(400,000.00)**
ජ'නර්ල් අංක 26					(2,286,656.80)				**(2,286,656.80)**
ජ'නර්ල් අංක 34			(1,142,543.24)			(4,694,446.15)			**(5,836,989.39)**
ජ'නර්ල් අංක 35			822,000.00			2,872,500.00			**3,694,500.00**
ජ'නර්ල් අංක 38		(200,245.00)		(65,759.00)		(726,812.00)			**(992,816.00)**
ජ'නර්ල් අංක 40						(1,575,214.00)			**(1,575,214.00)**
2023.12.31 දිනට ශේෂය	**27,090,000.00**	**9,305,040.24**	**822,000.00**	**1,426,200.76**	**1,008,417.06**	**5,071,630.00**	**3,192,290.00**	**1,827,000.00**	**47,915,578.06**

ජංගම නොවන වත්කම්

	රථ වාහන	ලී බඩු, කාර්යාල උපකරණ සහ සවි කිරීම්	යන්ත්‍ර හා පිරියත	දුරකථන	කාමර බෙදා වෙන් කිරීම	පරිගණක	වායු සමීකරණ	පරිගණක දත්ත පද්ධතිය	එකතුව
ක්ෂයවීම්									
2023.01.01 දිනට ශේෂය	**-**	**5,822,995.72**	**157,377.12**	**993,536.36**	**1,750,216.98**	**4,171,164.35**	**100,000.00**	**-**	**12,995,290.53**
වර්ෂය තුළ ක්ෂය කිරීම්	6,772,500.00	828,189.62	281,464.36	61,310.20	320,452.02	738,786.51		418,500.00	**9,002,702.71**
ජ'නර්ල් අංක 21							609,659.38		**609,659.38**
ජ'නර්ල් අංක 24		29,399.66							**29,399.66**
ජ'නර්ල් අංක 31							(100,000.00)		**(100,000.00)**
ජ'නර්ල් අංක 32					(1,750,216.98)				**(1,750,216.98)**
ජ'නර්ල් අංක 37			(428,144.22)			(2,439,740.67)			**(2,867,884.89)**
ජ'නර්ල් අංක 39		(166,094.54)		(42,224.38)		(723,062.00)			**(931,380.92)**
ජ'නර්ල් අංක 41						(1,708,656.20)			**(1,708,656.20)**
2023.12.31 දිනට ශේෂය	*6,772,500.00*	*6,514,490.46*	*10,697.26*	*1,012,622.18*	*320,452.02*	*38,491.99*	*609,659.38*	*418,500.00*	***15,278,913.29***
2023.12.31 දිනට ඉදිරියට ගෙන ආ අගය	**20,317,500.00**	**2,790,549.78**	**811,302.74**	**413,578.58**	**687,965.04**	**5,033,138.01**	**2,582,630.62**	**1,408,500.00**	**32,636,664.77**

2023 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 13-1

ආයතනය	ලෙජර් පිටු අංක	නිවාස ණය		ස්වයං රැකියා ණය		නව නිවාස ණය		එකතුව
		නිවාස ණය - දිගු කාලීන	නිවාස ණය - කෙටි කාලීන	ස්වයං රැකියා ණය - දිගු කාලීන	ස්වයං රැකියා ණය - කෙටි කාලීන	නව නිවාස ණය - දිගු කාලීන	නව නිවාස ණය - කෙටි කාලීන	
ලංකා බැංකුව	39 සහ 41	-	-	24,217,712.63	32,500,000.00	47,000,000.00	38,000,000.00	141,717,712.63
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	45	14,715,000.00	12,000,000.00	-	-	-	-	26,715,000.00
එකතුව		**14,715,000.00**	**12,000,000.00**	**24,217,712.63**	**32,500,000.00**	**47,000,000.00**	**38,000,000.00**	***168,432,712.63***

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 13-2

2023 දෙසැම්බර් 31 දිනට ණයදෙන ආයතනවලින් ලැබිය යුතු සේවා ගාස්තු

ආයතනය	ලෙජර් පිටු අංක	ගණන රු.
ලංකා බැංකුව	21	-
මහජන බැංකුව	23	-
රාජ්‍ය උකස් හා ආයෝජ	25	-
ලංකා බැංකුව - නිවාස - නව	29	-
ලංකා බැංකුව - ස්වයං රැකියා - නව	31	-
එකතුව		**-**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේඑල්ඕ/සී/ඩී/ආර්ඊපී/එෆ්ජේ/2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 30 දින

සභාපති

හානිපූර්ණය සඳහා වන කාර්යාලය

හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් 01 ලේකම් - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

02 ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No. ජේඑල්ඕ/සී/ඩී/ආර්ඊපී/එෆ්ඒ/2023

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 මැයි 30 දින

සභාපති

හානිපූර්ණය සඳහා වන කාර්යාලය

හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 9

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 70 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළ යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනයෙන් පසු මාස 12 ක් ඇතුළත කල්පිරෙන කෙටිකාලීන ආයෝජන රු.6,000,000 ක් දිගු කාලීන ආයෝජන තුළ පෙන්වීම නිසා ජංගම නොවන වත්කම්හි දිගුකාලීන ආයෝජනවල අගය රු.6,000,000 කින් වැඩියෙන් ද ජංගම වත්කමෙහි කෙටිකාලීන ආයෝජනවල වටිනාකම රු.6,000,000 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) 2023 ජනවාරි මස 12 වන දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව පාස්කු ප්‍රහාරය හේතුවෙන් මූලික අයිතිවාසිකම් කඩවූවන් සඳහා වන්දි ගෙවීමේ අරමුදලක් ඇති කළ අතර, මෙම අරමුදල සඳහා රාජ්‍ය දායකත්වය ලෙස ලැබුණු රුපියල් මිලියනයක මුදල හානිපූර්ණය සඳහා වන කාර්යාලයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ ආදායම් යටතේ පුනරාවර්ථන ප්‍රදාන ලෙස ද, එය වින්දිත අරමුදලට මාරු කිරීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් ලෙස ද ගිණුම්ගත කිරීම හේතුවෙන් පිළිවෙලින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ පුනරාවර්ථන ප්‍රදාන හා වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. තවද එම රුපියල් මිලියනය සහ අධිකරණ නියෝගයට අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ලද රු.35,825,588 ක මුදල් අරමුදලට බැර කර තිබුණු අතර, ඊට අදාළ ගණුදෙනු සඳහා වෙනම ගිණුම්පොත්පත් පවත්වාගෙන ගියද ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත ගණුදෙනු වාර්තා කර නොතිබුණි. ඊට අමතරව 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරි වී ඇති මුදල වන රු.2,894,838 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල වින්දිත අරමුදල් හා මුදල් ශේෂය තුල වාර්තා නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හිමිකම් හා මුදල් ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් වාර්තා කර තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේ දී වන්දි ලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000 ක් හා රු.112,900 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් අස්ථාන ගත වීමේ සම්පූර්ණ අලාභය පොත්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර තිබුණු අතර, මෙම කපා හැරීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ වියදමක් වශයෙන් වාර්තා නොකර සමුච්චිත අරමුදලෙන් අඩුකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ වර්ෂයේ වියදම රු.412,900 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කාර්යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කාර්යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදයට අනුව එහි ඇමුණුම 03 හි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කෙටුම්පත් වාර්තාවේ අවම වශයෙන් හෙළිදරව් කළ යුතු අංග වන ආයතනයේ දැක්ම හා මෙහෙවර, සභාපති අදහස් දැක්වීම, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව, විගණන කළමනාකරණ වාර්තාව හා පසු ගිය ආසන්නතම අවුරුදු 10 ක ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, 'ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවිකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

පිටුව 5 | 9

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
	(i.) මුදල් රෙගුලාසි 264 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී හානිපූර්ණය සඳහා වන කාර්යාලය විසින් විත්දිතයන් 362 දෙනෙකුට චෙක්පත් මගින් රු.547,526,491ක මුදලක් හා සෘජු ප්‍රේෂණ මගින් විත්දිතයන් 5,430 දෙනෙකුට රු.786,977,664 ක මුදලක් ගෙවා තිබුණද, අදාළ මුදල ආදායකයාට ලැබුණු බවට තහවුරු කර ගෙන නොතිබුණි.
	(ii.) මුදල් රෙගුලාසි 395(ඇ) ඡේදය	එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවද ආයතනය එසේ කටයුතු කර නොතිබුණි.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ 2.3 ඡේදය	(i.) මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව වාර්ෂිකව සිය ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, හානි පූර්ණ කාර්යාලයේ 2023 ක්‍රියාකාරී සැලැස්ම එපරිදි සකස් කර නොතිබුණි.
		(ii.) හානිපූර්ණ කාර්යාලයේ වාර්ෂික උපාය මාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 වර්ෂය සඳහා හානිපූර්ණය කාර්යාලයට අදාළව උපාය මාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. එහෙත් 2023 ක්‍රියාකාරී සැලස්ම සකස් කර අධ්‍යක්ෂක මණ්ඩලය පමණක් අනුමත කර තිබුණි. තවද එහි මුල් සැලැස්මේ

ක්‍රියාකාරකම් 07 ක් ඉවත් කර තිබූ බැවින් එම ක්‍රියාකාරකම් මුල් අවස්ථාවේ දී හඳුනාගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනත 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් කරුණු**

(අ) වන්දි ගෙවීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව නිවැරදිව තහවුරු කරගැනීම සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ ලිපිගොනු විස්තර ඇතුළත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියද එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට හානිපූර්ණය සඳහා වන කාර්යාලය අපොහොසත් විය. 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් වන්දි ගෙවීමට ඇති ලිපිගොනු 8,626 ක් පවතින බව කාර්යාලය විසින් දන්වා තිබුණ ද, අදාල ලිපිගොනු කුමන කාලපරිච්ඡේදයක සිට වන්දි අයදුම් කළ අයදුම්කරුවන්ගෙන් සමන්විත වන්නේද යන්න පිළිබඳ කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් වූ අතර, මින් ලිපිගොනු 4,917 කට අදාළ ව රු.1,802,446,195ක මුදලක් වන්දි ගෙවීමට නියමිතව තිබුණ ද, ඉතිරි ලිපිගොනු 3,709 ක ප්‍රමාණයට අදාළව වන්දි ගෙවීමට ඇති මුදල තක්සේරු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රුපියල් මිලියන 1,335 ක වන්දි ප්‍රමාණයෙන් රුපියල් මිලියන 753 ක වන්දි ගෙවා ඇත්තේ 2023 වර්ෂයේ අයදුම්කළ, අරගලයෙන් විපතට පත් වන්දිලාභීන්ට වන නමුත් පෙර වර්ෂවල සිට අනෙකුත් වන්දි සඳහා අයදුම් කළ වන්දිලාභීන්හට ගෙවා ඇත්තේ රුපියල් මිලියන 582 ක වන්දි මුදලක් පමණි. ඒ අනුව 2023 වර්ෂයට පෙර අයදුම්කළ වන්දිලාභීන්හට වන්දි ගෙවීමේ දී ප්‍රමුඛතාවක් ලබා දීම සාපේක්ෂ වශයෙන් අවම මට්ටමක විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළද වන්දිලාභීන්හට චෙක්පත් නිකුත් කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබාදීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය නිසි පරිදි

ඉටු වී නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට වන්දිලාභීන් හට ලබාදී තිබුණු චෙක්පත් අතුරින් රු.39,124,653 ක් වටිනා චෙක්පත් 318 ක තොරතුරු නිවැරදි නොවීම මත බැංකුව විසින් අගරු කර තිබුණි. මෙම වන්දි මුදල්වලින් රු.29,818,995 ක ප්‍රමාණයක් නැවත එම වන්දිලාභීන් වෙතම සෘජු ප්‍රේෂණ මගින් ලබා දී තිබුණු අතර, තවත් රු.9,305,658 ක ප්‍රමාණයක් නව වන්දි ලාභීන් 85 දෙනෙකු වෙත ලබා දී තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය කර තිබූ 2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විදුලිබලය හා ජලය වෙනුවෙන් අතුරුදහන් වූ කාර්යාලයෙන් අයවිය යුතු රු.737,485 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේ දී වන්දි ලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000 ක් හා රු.112,900 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් අස්ථානගත වීමේ සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පොත්වලින් කපා හැරීමට තීරණය කර තිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை
Office for Reparations - Sri Lanka

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதிசிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

මගේ අංකය. எனது இல. My No.	හානිපූරණ/විගණන විධායක අංකය. உமது இல. Your No.	දිනය. திகதி. Date	2024.07.03

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක. 306, පොල්දූව පාර,
බත්තරමුල්ල.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් ගුණාත්මක හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඉහත ඔබගේ අංක. JLO/C/D/REP/FA/2023 හා 2024 මැයි 30 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති විගණන විමසීම් වලට අදාල පිළිතුරු ඔබගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

ජේ.ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ ජනරාල්.

අංක.40, බුත්ගමුව පාර, රාජගිරිය
இல.40, புத்தகமுவ வீதி, ராஜகிரிய.
No.40, Buthgamuwa Road, Rajagiriya

කාර්යාලය / காரியாலயம் / Office: 011-2883939
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2886797
ඊ මේල් / மெயில் / E-mail: info@reparations.gov.lk
වෙබ් අඩවිය / இணையம் / Web Site: www.reparations.gov.lk

අ) නිරීක්ෂණ නිවැරදි ය. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අදාළ වර්ගීකරණය ඉදිරිපත් කර තිබුණ ද එකී වර්ගීකරණයේ ඇතුළත් විය යුතු, අගයන් ගණනය කිරීමේ දී දෝෂයන් සිදු ව ඇති බව පිළි ගනිමි.

එකී දෝෂය නිවැරදි කර ගනිමින් 2024 වර්ෂයේ දී අදාළ වර්ගීකරණයන් හී නියමිත අගයන් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරමි.

ආ) මෙකී විත්දිත අරමුදල වෙනුවෙන් නිසි පරිදි මුදල් පොත්, වැය ලෙජර හා වවුචර පත් විධිමත් පරිදි පවත්වාගෙන යයි. එසේ ම වරින් වර මෙම ගිණුමේ ලැබීම් හා ගෙවීම් වාර්තා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කරනු ලැබේ. කෙසේ නමුත් මෙකී අරමුදල ශ්‍රේෂ්ඨාධිකරණය මගින් නම් කරන ලද වගකිව යුතු පාර්ශවයන් වෙතින් හා ඒ වෙනුවෙන් එක් රැස්වන අරමුදල් සම්බන්ධයෙන් හා ආයතනයෙන් පරිබාහිර පාර්ශවයන් වෙනුවෙන් අරමුදල් රැස් කිරීම සඳහා රජය වෙනුවෙන් අරමුදල් රැස් කිරීමේ බලය මු.රෙ 876 යටතේ, භාණ්ඩාගාර ලේකම් වෙත බලය පැවරෙන හෙයින් හුදෙක් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය මත බැංකු ආයතනයක මෙකී ගිණුමක් පවත්වා ගැනීමට හැකි බව එවකට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාචික දැනුම් දීම මත මෙකී අරමුදල ස්ථාපිත කර ඇත. කෙසේ නමුත් මහා භාණ්ඩාගාරය විසින් අරමුදල ඇති කිරීම 2008 වර්ෂයේ සිට නවතා ඇති බැවින් අප ආයතනය විසින් අනුගමනය කළ ක්‍රියා මාර්ගය ප්‍රමාණවත් බව මාගේ හැගීමයි.

එසේම 2023 වර්ෂයේදී අවසන් ගිණුම් මඟින් අදාළ හෙලිදරව් කිරීම් සිදු කර ඇති අතර ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණයන්ට අනුව අනුකූලව 2024 වර්ෂයේ සිට මෙකී අරමුදල අවසාන ගිණුමට ගැලපීමට ද කටයුතු කරමි.

ඇ) 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේ දී වන්දිලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.3000,000/ හා රු.112,900/ ක් වටිනා ලිපිදව්‍ය තොගය අස්ථාන ගතවීමේ සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීම සඳහා මූලික විමර්ෂණ මණ්ඩල පත් කොට එකී මණ්ඩලවල නිර්දේශයන් මත මෙකී පාඩු නිශ්චිත වශයෙන් නිලධාරීන්ගේ වරදකින් සිදු නො වූවක් බව ට තහවුරු කර ගැනීමෙන් පසු අදාළ කරුණු සාමාජික මණ්ඩලය වෙත වාර්තා කිරීමෙන් අනතුරු ව සාමාජික මණ්ඩල අනුමැතිය මත ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර ඇත.

1.3 වාර්ෂික කෙටුම්පත් වාර්තාවට ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දී ඇති තොරතුරු ඉදිරියේදී ඇතුළත් කොට වාර්ෂික කෙටුම්පත් වාර්තාව සකස් කිරීමට සටහන් කර ගනිමි.

2.2.2.

අ)

i. මූල්‍ය ප්‍රදානයන් සඳහා දැනට අප වෙත ලැබී ඇති සම්පූර්ණ කරන ලද සෑම ලිපිගොනුවක ම යාවත්කාලීන කරන ගිණුම් තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය හෙයින් ඒ සඳහා සෑම ලිපිගොනුවකට ම අදාළ ව ගෙවීම් සිදු කිරීමට පෙර අදාල නව බැංකු විස්තර හෝ පවතින විස්තර වල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාල ප්‍රතිලාභියාට ලිපියක් යොමු කරනු ලබයි.මෙමඟින් යාවත්කාලී න තොරතුරු මත පමණක් පදනම්ව ගෙවීම් කිරීම සිදු වේ. මෙකී තොරතුරු ලද වහා ම ලිපිගොනුව යාවත්කාලීන කිරීමෙන් පසු ආදායකයින් වෙත මුදල් බැර කිරීම සිදු කරනු ලැබේ.

අදාල වන්දි මුදල් බැංකු ප්‍රේශණ හා චෙක්පත් මඟින් ගෙවීම් කල පසු වන්දි ලාභීන් වෙත ලැබී ඇති බවට ආයතනය වෙත දැනුම් දීම සඳහා ආවරණ ලිපියක් සකස් කර ඔවුන් වෙත තැපැල් මාර්ගයෙන් යවනු ලබයි.ඒ අනුව සමහර වන්දි ලාභීන් පමණක් එකී තහවුරුව ආපසු එවනු ලබන අතර යම් ප්‍රමාණයක් ප්‍රතිචාර දක්වනු නොලබයි.

ii. නිරීක්ෂණ නිවැරදි ය. කෙසේ නමුත් ,මුදල් රෙගුලාසි ප්‍රකාරව පවත්නා මාසයේ බැංකු සැසඳුම් ඊලඟ මාසයේ 15 වන දිනට පෙර ලබා දීමට ගිණුම් අංශය මඟින් කටයුතු කරමි.

ආ)

i. නිරීක්ෂණයට එකඟ වේ.

විගණන විමසුමේ සඳහන් කරන පරිදි පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක:01/2021 පදනම් කොට ගෙන ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කර ඇත.

ii. නිරීක්ෂණයට එකඟ වේ.

විගණන විමසුමේ සඳහන් කරන පරිදි පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක:01/2021 පදනම් කොට ගෙන ඉදිරියේදී උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට කිරීමට කටයුතු කරමි.

2023 වර්ෂයේ හානිපූරණ කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන අමාත්‍යාංශයට යොමු කොට ඇත.නමුත් පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක:01/2021 අනුව, අප ආයතනය විසින් එය අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් භාණ්ඩාගාරයට යොමු කිරීමට කටයුතු කොට නොතිබුණි.ඉදිරියේදී අදාල චක්‍රලේඛය පදනම් කර ගනිමින් එම කටයුතු සිදු කිරීමට කටයුතු කරමි.

2.2.3 හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් වාර්ෂික බලතල බෙදා හැරීමේ ලේඛනය සකස් කොට ගණන් දීමේ නිලධාරියා විසින් අදාළ නිලධාරීන්ට වගකීම් හා කාර්යයන් ලබා දීම් සිදු කොට ඇත.කෙසේ නමුදු වර්තමානයේදී ප්‍රමාණවත් පරිදි නිලධාරීන් සංඛ්‍යාව නොවීම හේතුවෙන් හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සීමා කිරීම් පැවතීම හේතුවෙන් සමහර අවස්ථා වලදී මෙවැනි තත්වයක් උද්ගත වී ඇත.කෙසේ නමුත් පවත්නා සීමිත නිළධාරීන් සංඛ්‍යාවෙන් ආයතනයේ පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා කටයුතු කරනු ලබයි.කෙසේ නමුදු ඉදිරියේදී පවතින පුරප්පාඩු සම්පූර්ණ කොට නිසි පරිදි වගකීම් සහ කාර්යයන් ඉටු කිරීමට වග බලා ගනිමි.

2.2.4 වර්ෂයේ මිලදී ගැනීම් සිදු කිරීම සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සැලසුම් කර තිබුණද ප්‍රායෝගික දුශ්කරතා මත ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කල කාල සීමාවන් වලදී සිදු කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. කෙසේ නමුත් රාජ්‍ය විවිධ නීති ගත සංස්ථාව (Sri Lanka State Trading Corporation) මඟින් එක් මිලකියුමකින් රු.මිලියන 20 ක්දක්වා මිලදී ගත හැකි බවට ඇති 2023.07.14 දිනැති කැබිනට් පත්‍රිකා අංක 23/1305/604/133 මඟින් ලැබී ඇති කැබිනට් අනුමැතිය මත ප්‍රසම්පාදන කටයුතු නීත්‍යානුකූලව සිදු කොට ඇත.

2.3

අ) ඔබගේ නිරීක්ෂණයට පාදක වූ ඔබගේ අංක JLO/C/D/REP/2023/11/11-4 - හා 2024/02/21 දිනැති විගණන විමසුම මගින් නොගෙවා ඇති වන්දි ලිපිගොනු 8626 න් වන්දි ගෙවීමට අනුමැතිය හිමි වී ඇති ලිපිගොනු 1711 ක් සඳහා තක්සේරු වටිනාකම අපගේ අංක හානිපූරණ/අ.වි./විගණන විමසුම/2024 හා 2024.02.26 දිනැති ලිපිය මගින් රුපි. 196,030,110 ක් බව දැනුම් දෙන ලදී.

ඒ අනුව ඉතිරි වන්දි ලිපිගොනු 6915 ක ප්‍රමාණය සඳහා වන්දි මුදල් අනුමත කර නොමැති වුවද වක්‍රලේඛ සීමාවන්ට අනුව විෂයභාර නිලධාරීන් විසින් තක්සේරු කර ඇති ලිපිගොනු හා අමාත්‍ය මණ්ඩල තීරණ, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව නියමිත වන්දි මුදල් ප්‍රමාණයන් පදනම් කර ගනිමින් පහත සඳහන් පරිදි තක්සේරු වටිනාකම් ඉදිරිපත් කළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

එසේම, ඉහත නොගෙවා ඇති ලිපිගොනු අතරින් , අවශ්‍ය ලේඛණ සම්පූර්ණ කර නොතිබීම, වන්දි සඳහා හිමිකම් නොමැතිවීම, ලිපිගොනු වසා තැබීම යනාදි හේතූන් මත වන්දි මුදල් තක්සේරුවක් ඉදිරිපත් කළ නොහැකි ලිපිගොනු පිලිබඳ විස්තරද පහත ඉදිරිපත් කරමි.

අනු අංකය	මූල්‍ය සහන වැඩසටහන	තක්සේරු වටිනාකම ඉදිරිපත් කළ හැකි ලිපිගොනු සංඛ්‍යාව	තක්සේරු වටිනාකම (රුපි.)	තක්සේරු වටිනාකම ඉදිරිපත් කළ නොහැකි ලිපිගොනු සංඛ්‍යාව	එකතුව
1	උතුරු නැගෙනහිර ආශ්‍රිත ගැටුම් හේතුවෙන් පීඩාවට පත්වූවන් වෙනුවෙන් මූල්‍ය සහන ලබාදීම	1545	195,505,804	929	2474
				*2201	2201
2	අතුරුදහන්වූවන්ගේ පවුල් වෙනුවෙන් පුනර්ජීවන දීමනා ගෙවීම	1556	311,200,000		1556
3	2022 මැයි 09 සිදුවූ දේශපාලන නොසන්සුන්තාවයන් හේතුවෙන් හානියට පත් නිශ්චල දේපල වෙනුවෙන් මූල්‍ය සහන සැලසීම				
	මරණ	6	30,000,000		6
	නිශ්චල දේපල	99	1,069,710,281	79	178
	චංචල දේපල			500	500
	එකතුව	3206	1,606,416,085	3709	6915

* සටහන

දෛනිකව අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය ලැබීමෙන් පසුව නිවැරදි තක්සේරුව ලැබේ. මෙම ලිපිගොනු සංචලනය වන ලිපිගොනු වන අතර තක්සේරු වටිනාකම අනුමැතිය ලැබීමෙන් පසුව ලබාදීය හැකිය.

ආ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇති , හානිපූරණය සඳහා වන කාර්යාලයීය පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස්කොට ඇති හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ හා රීතීන්ට අනුකූලව අවශ්‍යතාවයන් හි ප්‍රමුඛතාවය, සම්පත්වල සුලභතාවය යන කරුණු පදනම් කර ගෙන ලබාදීය යුතු මූල්‍ය සහනයන් පිලිබඳ තීරණ ගත හැකිවේ.

ඒ අනුව 2022 මැයි 09 දින සිදුවූ දේශපාලන නොසනුසුන්තාවයන් හේතුවෙන් අවශ්‍යතා ප්‍රමුඛතාවය මත පීඩාවටපත්වුවන්ගේ නිවාස වලට සිදුවූ හානි සඳහා හානිපූරණයන් සැලසීමට අධ්‍යක්ෂ මණ්ඩලයත්, අමාත්‍ය මණ්ඩලයත් අනුමත කර ඇත.

ඒ අනුව රජයේ තක්සේරුකරු විසින් නිකුත්කර ඇති තක්සේරු වාර්තාව මත පදනම්ව මූල්‍ය සහන ලබාදීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබී ඇති බැවින් ද , එහි ප්‍රමාණය සාපේක්ෂව අනිකුත් මූල්‍ය සහන ක්‍රමයන් යටතේ ගෙවනු ලබන ප්‍රමාණයට වඩා ඉහල බැවින් නිරීක්ෂණයෙහි සඳහන් මූල්‍ය වෙනසට හේතුවී ඇත.

තවද, 2023.12.31 දින වන විට මියගිය හා තුවාල ලැබූ පුද්ගලයන් වෙනුවෙන් තවදුරටත් මූල්‍ය සහන ලබාදීමට ඉල්ලුම්පත් ඉතිරිව නොමැතිවීමත්, අතුරුදහන් පුද්ගලයන් වෙනුවෙන් සහ පාස්කු ප්‍රහාරයෙන් දේපල හානි සම්බන්ධයෙන් ලේඛන සම්පූර්ණව පැවති ලිපිගොනු සියල්ලටම ගෙවීම් කර අවසන් කර ඇති බවද සඳහන් කරමි.

ඇ) නිරීක්ෂණයට එකඟ වේ.

ස්ලිප් ක්‍රමය(Slip System) යටතේ සිදු වන අගරු වීම් වළක්වාලීම සඳහා ගෙවීම් සිදු කිරීමට පෙර අදාල නව බැංකු විස්තර හෝ පවතින විස්තර වල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාල ප්‍රතිලාභියාට ලිපියක් යොමු කරනු ලබයි.මෙමඟින් යාවත්කාලී න තොරතුරු මත පමණක් පදනම්ව ගෙවීම් කිරීම සිදු වේ.

ඈ) අඛණ්ඩ ව අතුරුදහන්වූවන්ගේ කාර්යාලය වෙත අදාළ ඉල්ලිම් යොමු කොට මෙකී මූදල හැකි ඉක්මනින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරමි.

ඉ) 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරය සඳහා චන්දි ප්‍රදානය කිරීමේ දී චන්දිලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000/ හා රු.112,900/ ක් වටිනා ලිපි ද්‍රව්‍ය තොගය අස්ථාන ගතවීමේ සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීම සඳහා මූලික විමර්ෂණ මණ්ඩල පත් කොට එකී මණ්ඩලවල නිර්දේශයන් මත මෙකී පාඩු නිශ්චිත වශයෙන් නිලධාරීන්ගේ වරදකින් සිදු නො වූවක් බව ට තහවුරු කර ගැනීමෙන් පසු අදාළ කරුණු සාමාජික මණ්ඩලය වෙත වාර්තා කිරීමෙන් අනතුරු ව සාමාජික මණ්ඩල අනුමැතිය මත ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර ඇත

ජේ.කෘෂ්ණමූර්ති
අධ්‍යක්ෂ ජනරාල්.